බස්නාහිර පළාත් සභාව - 2025

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බස්නාහිර පළාත් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණවත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2026 ජූනි 22 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජූනි 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශවලින් 2025 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු ආයතන 09 ක වටිනාකම රු. මිලියන 625 ක් වූ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කර නොතිබූ අතර, පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් වටිනාකම හා දේපළ, පිරියත හා උපකරණ සංචිත අරමුදල ද එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම් හා සංචිත අරමුදල නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් සභාවේ ප්‍රඥප්තිගත ආයතන 08 ක් සතු රු.මිලියන 5,364 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් හා ආයතන 05 ක රු. මිලියන 142 ක ස්ථාවර තැන්පතු ශේෂයන් පැවතුණ ද එම වටිනාකම් පළාත් සභා අරමුදලේ | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉදිරියේදී ප්‍රඥප්තිගත ආයතන සතු මූල්‍ය නොවන වත්කම් සහ ස්ථාවර තැන්පතු වටිනාකම් නිවැරදිව හඳුනාගෙන හෙළිදරව් |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | | කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) | බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළව 2025 දෙසැම්බර් 31 දිනට නොවිසඳී ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නඩු 23 ක්, අභියාචනාධිකරණ නඩු 70 ක්, සිවිල් අභියාචනාධිකරණ නඩු 05 ක්, මහාධිකරණ නඩු 112 ක්, දිසා අධිකරණ නඩු 32 ක්, මහේස්ත්‍රාත් අධිකරණ නඩු 04 ක්, කම්කරු විනිශ්චයාධිකරණ නඩු 01 ක් ලෙස එකතුව නඩු 247 ක් පැවති අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් එම නොවිසඳී ඇති නඩු පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ඉදිරියේදී නොවිසඳී ඇති නඩු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | ආණ්ඩුකාරවර කාර්යාලයේ හදිසි අවස්ථා අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු. මිලියන 108 ක් වූ ස්ථාවර තැන්පතු හා රු. මිලියන 14 ක් වූ පොලී ආදායම් පළාත් සභා මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ඉදිරියේදී හදිසි අවස්ථා අරමුදලේ ඇතුළත් ස්ථාවර තැන්පතු හා පොළී වටිනාකම් මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | පළාත් සභා අරමුදල් ගිණුමේ මූල්‍ය ප්‍රකාශන අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදමරු. මිලියන 4,211 ක් වුවද මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් ලෙස ගිණුම්ගත කර තිබූ වටිනාකම රු. මිලියන 482 ක් පමණක් වීමෙන් රු. මිලියන 3,729 ක වෙනසක් විය. | වත්කම් ගිණුම් ගත කිරීම සම්බන්ධව සැසඳීම් වාර්තාවක් සකස් කර ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව. | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් නිවැරදිව හඳුනාගෙන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව බස්නාහිර පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 1.5.1 ශීර්ෂය 100 - ආණ්ඩුකාරවරයා

#### 1.5.1.1 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුකාරවරයා වෙත යොමු වූ පැමිණිලි සම්බන්ධයෙන් කඩිනමින් පරීක්ෂා කිරීම් කර ගැනීමේ අරමුණින් නිලධාරීන් 09 දෙනෙකුගෙන් යුත් විශේෂ විමර්ශන කමිටුවක් පිහිටුවා එම නිලධාරීන් වෙත 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා දීමනා ලෙස රු. 824,800 ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම කමිටුව විසින් සිදු කළ විමර්ශනවලට අදාළ වාර්තා ඉදිරි කටයුතු සඳහා උපයෝගි කර ගෙන නොතිබුණි. | විශේෂ විමර්ශන ඒකකයේ පරීක්‍ෂණ මූලික විමර්ශන යටතට නොගැනෙන බව. | විශේෂ විමර්ශන වාර්තා වල නිර්දේශ ඉදිරි කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂය 101 - බස්නාහිර පළාතේ පළාත් සභාව

#### 1.5.2.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා කටයුතු ක්‍රියාත්මක නොවුණු කාල පරිච්ඡේදය තුළ පළාත් සභාවේ සභාපතිගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ රියදුරන් දෙදෙනෙක් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ලෙස රු. මිලියන 2 ක් ගෙවා තිබුණි.පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසු පළාත් සභාවේ සභාපති ධූරය දරන තැනැත්තාට කළ යුතු ස්ථිර කාර්යයක් නොමැති බැවින් දෛනිකව පළාත් සභා ලේකම් කාර්යාලයට පැමිණ නොතිබුණ නමුත් රු. මිලියන 67ක් වටිනා වාහන දෙකක් සඳහා ඉන්ධන දීමනා ලෙස රු. මිලියන 2 ක් ලබා දී වාහනවල නඩත්තු වෙනුවෙන් රු. මිලියන 4 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි. ඊට අමතරව ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන සභා | පළාත් සභා පනතේ 7(2) වගන්තිය ප්‍රකාරව විසුරුවා හැරීමෙන් පසු පැවැත්වෙන සභාවේ ප්‍රථම රැස්වීම තෙක් සභාපති ධූරය හිස් නොකළ යුතු බැවින් සභාපතිට හා කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවා ඇති බව හා 2009 ඔක්තෝබර් 14 දිනැති පළාත් සභා අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාර ආණ්ඩුකාර අනුමැතිය මත ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා නොකරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අවශ්‍යතාව හඳුනාගෙන අදාළ වියදම් පමණක් දැරිය යුතුය. |

ලේකම් කාර්යාලයේ සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු. මිලියන 3.6 ක් ගෙවා තිබුණි.

### 1.5.3 ශීර්ෂය 102 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

#### 1.5.3.1 නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය සේවා කොමිෂන් සභා, සභාපති තනතුර නිල වාහන සඳහා හිමිකම් ඇති තනතුරක් ලෙස චක්‍රලේඛයේ දක්වා නොමැති අතර සතියකට දින 02 ක් කොමිෂන් සභාව වෙත පැමිණීම සඳහා සභාපති වෙත නිල රථයක් හා මාසිකව ලීටර් 230 කට සමාන ඉන්ධන දීමනා ලෙස 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා රු. මිලියන 4.6 ක් ගෙවා තිබුණි. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ගෙවා ඇති බව. | චක්‍රලේඛයේ දක්වා නොමැති තනතුරු සඳහා දීමනා ගෙවීමට කටයුතු නොකළ යුතු අතර චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ලෙස කරන ලද ගෙවීම් අය කළ යුතුය. |

### 1.5.4 ශීර්ෂ අංක 103 - සමූපකාර සේවක කොමිෂන් සභාව

#### 1.5.4.1 නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපතිවරයා නිල වාහනයක් හිමි තනතුරකට ඇතුළත්ව | 2014 වර්ෂයේ සිට ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් ගෙවා ඇති බවත්, අමාත්‍යාංශය මඟින් | චක්‍රලේඛයේ දක්වා නොමැති තනතුරු සඳහා දීමනා ගෙවීමට කටයුතු නොකළ යුතු අතර චක්‍රලේඛ විධිවිධානවලට |

| | | | | |
|---|---|---|---|---|
| | | නොතිබුණ නමුත් කොමිෂන් සභාවේ සභාපතිවරයාට මසකට ඉන්ධන ලීටර් 145 කට සමාන ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි .ඒ අනුව 2020 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා චක්‍රලේඛයට පටහැනිව ඉන්ධන දීමනා ලෙස රු.මිලියන 03 ක් ගෙවා තිබුණි. | උපදෙස් ඉල්ලා ඇතත් මෙතෙක් උපදෙස් ලැබී නොමැති බැවින් අනුමත දීමනාව මාසිකව ගෙවීමට කටයුතු කරන බව. | අනුකූල නොවන ලෙස කරන ලද ගෙවීම් අය කළ යුතුය. |
| **(ආ)** | 1973 අංක 05 දරන සමූපකාර රීති මාලාවේ 28 වන වගන්තිය, 1994 අංක 01 දරන සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය හා 1972 අංක 12 දරන සමූපකාර සේවක කොමිෂන් සභා පනත | පනත යටතේ සම්පාදිත රෙගුලාසි මාලාවේ විධිවිධානවලට අනුව ලියාපදිංචි සමූපකාර සමිතියකට සමූපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය නොමැතිව සේවකයෙකු පත්කළ නොහැකි වුවද, සමාලෝචිත වර්ෂය වන විට බස්නාහිර පළාත තුළ ක්‍රියාකාරී සමූපකාර සමිති 1,203 න් සමූපකාර සමිති 67 කට කොමිෂන් සභාවේ අනුමැතිය ලබා නොගෙන සේවකයින් 1,455 ක් පත් කර තිබුණි. එම අවිධිමත් පත්වීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමූපකාර සේවක කොමිෂන් සභාවට හැකි වී නොතිබුණි. | තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වන අතර ඔවුන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය දෙපාර්තමේන්තුව සතු වන බැවින්, සේවකයින්ට ගෙවූ මුදල් ආපසු අය කිරීමට නීතිමය පියවර ගැනීමට නීති නිලධාරී වෙත යොමු කර ඇති බව. | ප්‍රඥප්ති/පනත් ප්‍රකාරව කටයුතු කර අවිධිමත් පත්වීම් හා ගෙවීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.5.5 ශීර්ෂය 104 - පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය

### 1.5.5.1 අතහැර දැමූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැළැස්මට අනුව ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර තිබූ ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 121.87 ක් වූ ප්‍රතිපාදන ලැබී තිබූ ව්‍යාපෘති 54 ක් අවලංගු කර තිබුණි. | 2025 දෙසැම්බර් 01 දිනැති ප්‍රධාන ලේකම්ගේ ලිපිය පරිදි අනුමත කර ඇති නමුත් ක්‍රියාත්මක මට්ටමේ නොපැවති ව්‍යාපෘති අවලංගු කරන ලෙස දන්වා එවූ බව. | සැළසුම් කර තිබූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5.2 ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය

#### 1.5.5.2.1 දෘෂ්‍ය අක්‍රමිකතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයට අවශ්‍ය කසළ බෑග් හා හාඩ්වෙයාර් අයිතම සැපයීම එකම පෞද්ගලික ආයතනයක් විසින් සිදුකර තිබුණු අතර, එම කාලපරිච්ඡේදය සඳහා රු. මිලියන 169 ක් එම ආයතනයට ගෙවා තිබුණි. මිලදී ගැනීම් වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ සිදුකර තිබුණ අතර ව්‍යාපෘතිය ආරම්භ කළ 2019 වර්ෂයේදී ආයතනය තෝරා ගැනීමේදී පූර්ව සුදුසුකම් පරීක්ෂාවන් සිදුකර නොතිබූ අතර එකම ආයතනයකින් පමණක් මිලදී ගැනීම් සිදුකිරීම හේතුවෙන් 2019 සිට 2024 වර්ෂය දක්වා රු.මිලියන 74 ක පාඩුවක් කාර්යාංශයට සිදුවී තිබුණි. | පැහැදිලි කිරීම් ඇතුළත් වාර්තාවක් පිළියෙල කරමින් පවතින බව. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව මිලදී ගැනීමේ කටයුතු සිදු කළ යුතු අතර සිදු වී ඇති පාඩුව සම්බන්ධයෙන් අදාළ කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ 2022 හා 2023 වර්ෂ වලදී සිදුවී තිබූ මුද්‍රණ කඩදාසි තොග වංචාව පිළිබඳව විමර්ශනයේදී අනාවරණය වූ වටිනාකම රු. මිලියන 42 ක් විය. මුද්‍රණාලය සතුව අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපනය කර තිබුණද මුද්‍රණාල ප්‍රධානීගේ හා ආයතනයේ ඉහළ කළමනාකරණයේ අනවධානය හේතුවෙන් එම ක්‍රමවේද පහසුවෙන් මගහැර යෑමට හැකියාවක් පැවතීම හා නිසි අධීක්ෂණයක් නොමැති වීම වැනි කරුණු මත විගණනයට ප්‍රමාණවත් සාක්ෂි සපයා ගැනීමට නොහැකිවීම නිසා අනාවරණය වූ වංචාවේ වටිනාකම මෙම ප්‍රමාණයට වඩා ඉහළ වටිනාකමක් විමේ හැකියාව පැවතුනි. | හිටපු මුද්‍රණාල ප්‍රධානි විසින් ගෙවීම් සිදු නොකරන බව හා තවත් නිලධාරීන් දෙදෙනෙකු අභියාචනා ඉදිරිපත් කර ඇති බව. | වංචාවට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව නීත්‍යානුකූල පියවර ගැනීම කඩිනමින් සිදු කොට ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු අතර විගණනයට ප්‍රමාණවත් සාක්ෂි සැපයිය යුතුය. |

### 1.5.5.3 බස්නාහිර පළාත් සංචාරක මණ්ඩලය

#### 1.5.5.3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පිරිවැය රු. මිලියන 186 ක් වැය කර ඉදිකරන ලද ඒත්තුකාල ජල උද්‍යාන ව්‍යාපෘතිය වැඩ අවසන් කර සංචාරක මණ්ඩලය වෙත ආපසු භාරදී වසර 10 ක් ඉක්මවා පැවතියද සංචාරක ආකර්ෂණයට යොදා ගැනීමට පියවර ගෙන නොතිබුණි. දැනට වසර 05 ක පමණ කාලයක සිට භාවිතයට නොගෙන තිබීම ජල උද්‍යානයේ දේපළවලට හානි සිදු වීම, අලුත්වැඩියාවන් සිදු නොකිරීම වැනි හේතු නිසා නැවත භාවිතයට ගැනීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. තවද, උද්‍යානය පිහිටි ඉඩමේ අයිතිය මණ්ඩලය වෙත පවරා ගැනීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදු කර තිබුණි. එමෙන්ම මෙම ජල ව්‍යාපෘතියෙන් 2020 වර්ෂයේ සිට අයවිය යුතු කුළී ආදායම් රු.289,373 ක් විය. | මෙම ව්‍යාපෘතිය පිහිටි භූමිය සංචාරක විභවයක් තිබෙන ප්‍රදේශයක පිහිටා ඇති බැවින් වෙනත් විකල්ප ක්‍රියාමාර්ග මඟින් ආයෝජන අවස්ථාවන් සපුරා ගැනීමට අපේක්ෂා කරන බව හා කොවිඩ් වසංගතය, පාස්කු ප්‍රහාරය සහ අරගල සමයේ සිදු වූ හානි නිසා කුළී මුදල් ගෙවීමේ හැකියාවක් නොමැති බව මීගමුව මහ නගර සභාව විසින් දැනුම් දී ඇති බව. | සංචාරක ආකර්ෂණය දිනා ගැනීමට කටයුතු කිරීම තුළින් ආදායම් ලබා ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 මැයි 09 දින රට තුළ ඇති වූ කලබලකාරී තත්ත්වය හේතුකොට ගෙන කිසියම් පිරිසක් විසින් සංචාරක මණ්ඩලයට අයත් ඒත්තුකාල ජල උද්‍යානයේ දේපළවලට හානි සිදුකර පැවති අතර එම හානිය රු. මිලියන 3.5 ක් බවට ඇස්තමේන්තු කර තිබුණි. මෙම අලාභහානි සිදු කර වසර 04 කට ආසන්න කාලයක් ගත වී තිබුණ නමුත් හානිය සම්බන්ධව අවශ්‍ය කිසිදු පියවරක් මණ්ඩලය විසින් ගෙන නොතිබුණි. | මේ පිළිබඳව මීගමුව ප්‍රාදේශීය ලේකම් මඟින් දිස්ත්‍රික් ලේකම් දැනුවත් කර ඇති අතර ඉදිරි කටයුතු කරගෙන යන බව | අලාභ හානි අයකර දේපළ යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.5.4 අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය

#### 1.5.5.4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | බස්නාහිර පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රු. මිලියන 63 ක් වැය කර ආරම්භ කළ දියර පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් 01 දින සිට බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත පවරා තිබුණි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර, ශක්‍යතා අධ්‍යයනයක් කර නොතිබුණ අතර ඉදිකිරීම් සම්බන්ධයෙන් අදාළ අනුමැතීන් ලබා ගැනීම සිදුකර නොතිබුණි. මාළු දියර පොහොර අංගනයක් ඉදිකිරීම සහ ඊට අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා අධිකාරිය විසින් රු. මිලියන 136 ක් වැය කර තිබුණද අංගනය විවෘත කළ දින වන 2024 සැප්තැම්බර් 18 දින සිට 2026 මැයි මස දක්වා ව්‍යාපෘතියේ කටයුතු කර නොතිබුණු අතර නිෂ්පාදනාගාරයෙහි සවි කර තිබූ යන්ත්‍ර හා උපකරණ වසරකට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | දියර පොහොර ව්‍යාපෘතිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහන සඳහා ලබාදුන් බව හා විධිමත් ලෙස යන්ත්‍ර සූත්‍ර භාරදුන් පසු රාජ්‍ය, පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතියක් ලෙස දියර පොහොර නිෂ්පාදනය කිරීමට නියමිත බව. | උපකරණ ඵලදායි ලෙස භාවිතා කර දියර පොහොර නිෂ්පාදනය සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2020 වර්ෂයේ සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 72 ක් වැයකර ක්‍රියාත්මක කළ ජපන් ජබර කොම්පෝස්ට් ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් 01 දින සිට බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය වෙත පවරා තිබූ අතර එකතුව රු. මිලියන 30 ක් වූ වත්කම් අයිතම 54 ක් වසර 02 කට අධික කාලයක සිට ඵලදායී ආර්ථික කටයුත්තක් සඳහා උපයෝජනය කර නොතිබුණි. | 2022 සැප්තැම්බර් 01 දින සිට අධිකාරිය වෙත පවරා ඇති බව. | උපකරණ ඵලදායී ලෙස භාවිතා කොට ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.6 ශීර්ෂය 105 - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය

#### 1.5.6.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 18 දින රු. මිලියන 5 ක් වැය කර ඉංජිනේරු කාර්යාංශය විසින් මිල දී ගත් Agras T16 සහ Matric 300RTK දරන ඩ්‍රෝන යාත්‍රා දෙක පිළිවෙලින් 2025 ජනවාරි සිට ඔක්තෝබර් අවසානය දක්වා අවස්ථා 3 ක් හා අවස්ථා 16 ක් පමණක් භාවිතයට ගෙන තිබිය දී, නැවත වරක් 2023 ඔක්තෝබර් 31 දින රු.මිලියන 14 ක් වැය කර AgrasT20 සහ Matric 350RTK යන ඩ්‍රෝන යාත්‍රා දෙකක් නැවත මිල දී ගෙන තිබුණු අතර එම යාත්‍රා දෙක අවස්ථා 5 ක් පමණක් භාවිතා කර තිබුණි. | මෙම යානා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත පවරා දීම යෝග්‍ය බව යෝජනා කර 2026 මැයි 19 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ද යොමු කර ඇති බව. | ඩ්‍රෝන යානා 04 ප්‍රයෝජනවත්ව භාවිතා කරන පාර්ශවයකට භාර දීම හෝ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් Matric 350RTK යන ඩ්‍රෝන යාත්‍රාව 2025 ජනවාරි 08 දින ජින්තුපිටිය ප්‍රදේශයේ | මෙම ඩ්‍රෝන යානා අනතුරට අදාළව හානි පාඩු පරීක්ෂණ | පාඩු හඳුනාගෙන කඩිනමින් ඉදිරි කටයුතු සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ඩෙංගු මදුරුවන් බෝවන ස්ථාන නිරීක්ෂණය කිරීම සඳහා පියාසර කරමින් සිටියදී අනතුරට ලක්ව තිබූ අතර ඒ සම්බන්ධයෙන් ගුවන් හමුදා මූලස්ථානය විසින් සිදු කළ විමර්ශන වාර්තාවට අනුව රු. මිලියන 5.6 ක් ලෙස අලාභය හඳුනාගෙන තිබූ නමුත් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සිදුකර නොතිබුණි. | මණ්ඩලයක් පිහිටුවීමට, ඩ්‍රෝන යානා තාක්ෂණ දැනුම සහිත නිලධාරියෙකු නම් කර එවන ලෙස ඉල්ලා ගුවන් හමුදාපති වෙත ලිපි 03 ක් යොමු කර ඇති බවත්, ඒ සඳහා නිලධාරියෙකු නම්කර එවූ පසු හානි පාඩු පරීක්ෂණ මණ්ඩලයක් පිහිටුවා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | |

**1.5.7 ශීර්ෂය 106 - කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශය**

**1.5.7.1 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෘෂිකර්ම අමාත්‍යාංශයේ රු. මිලියන 56 ක් වටිනා අමාත්‍යාංශ ලේකම්ගේ නිල නිවස පිහිටි නාරාහේන්පිට ඉඩම අමාත්‍යාංශයට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද නොහැකි වී තිබුණි. | ගතයුතු ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ඉදිරි කටයුතු බාහිර ආයතනය විසින් කළ යුතු බව. | අදාළ දේපළ අමාත්‍යාංශය වෙත පවරා ගත යුතුය. |

**1.5.7.2 කෘෂි සේවා අධිකාරිය**

**1.5.7.2.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ රීති 54.5, 54.6, 55.2 සහ 55.4 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම ප්‍රාරම්භක වාර්තාවක් හෝ එසේ කළ නොහැකි විට අලාභ හානියක් සිදු වූ දින සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ලබා දිය යුතු | කමිටුවක් පත්කර ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන බව. | මූල්‍ය රීති ප්‍රකාරව අලාභහානි සම්බන්ධයෙන් කටයුතු කර අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| | වුවත් 2018 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ සිදු වූ එකතු වටිනාකම රු. මිලියන 2 ක අලාභ හානි 13 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 2012 අංක 01 දරන කෘෂි සේවා අධිකාරී ප්‍රඥප්තිය ප්‍රකාරව අධිකාරියට පැවරී ඇති පරමාර්ථ අතුරින් කෘෂිකාර්මික වාණිජ ව්‍යවසායකයන් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයන් ගෙන නෙතිබුණි. ඒ අනුව අධිකාරිය විසින් අඛණ්ඩව නියමිත පරමාර්ථ සම්පූර්ණයෙන් ඉටු නොකිරීම හේතුවෙන් බස්නාහිර පළාතේ කෘෂිකාර්මික සංවර්ධනයට සහ ආර්ථික වර්ධනයට අපේක්ෂිත දායකත්වයක් ලබා දී නොතිබුණි. | කෘෂිකාර්මික වාණිජ ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව කෘෂිකාර්මික වාණිජ ව්‍යවසායකයන් සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |

## 1.5.8 ශීර්ෂය 107 - මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය

### 1.5.8.1 බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

#### 1.5.8.1.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය අනුව බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට නීත්‍යානුකූලව මාර්ග බලපත්‍ර ලබාදිය හැක්කේ බස්නාහිර පළාත් සීමාව තුළ ගමනාන්ත යෙදෙන මාර්ග සඳහා පමණක් වන අතර, අන්තර් පළාත් සේවාවන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ බලය ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු නමුත් ඊට පටහැනිව අධිකාරිය විසින් බස් රථ 110 ක් සඳහා පිළිවෙළින් දකුණු පළාතට 18 ක්, සබරගමුව පළාතට 39 ක් සහ වයඹ පළාතට 53 ක් ලෙස අවසර පත්‍ර නිකුත් කර | ජනතාවට පහසුවෙන් ලගා විය හැකි යටිතල පහසුකම් සහිත ජනාකීර්ණ ස්ථානයක් නොමැති විට පළාත් සීමාවෙන් ඔබ්බට ඇති උප නගරයක් ගමනාන්තය ලෙස තෝරා ගන්නා බව. | ප්‍රඥප්ති ප්‍රකාර විධිමත් පරිදි ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ලබා දුන් බලපත්‍ර සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි .එසේම 2020 වර්ෂයේ සිට 2026 ජනවාරි 31 දින දක්වා අධිවේගී මාර්ගය හරහා දකුණු පළාතේ නෙළුව, පිටිගල, මිරිස්වත්ත සහ අවිත්තාව දක්වා ධාවනය කිරීම සඳහා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව මගී සේවා අවසර පත්‍ර 10 ක් සහ වයඹ පළාතේ ගිරිඋල්ල දක්වා අවසර පත්‍ර 04 ක් ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ නිර්දේශ මත හිටපු සභාපතිවරයා විසින් නිකුත් කර තිබුණි. | | |
| (ආ) | 2014 සිට 2019 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් ටෙන්ඩර් බලපත්‍ර ගාස්තු සම්පූර්ණයෙන් ගෙවා නොතිබූ බස් රථ හිමියන් 100 දෙනෙකුගෙන් අය නොවී පවතින රු. මිලියන 26 ක ශේෂයක් වසර 06 ත් 11 ත් අතර කාලයක සිට අය නොවී පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ටෙන්ඩර් බලපත්‍ර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මගී සේවා බස් රථ ධාවනය නවතා මාස 06 කට වඩා ධාවනයෙන් ඉවත් වූ බස් රථවල මාර්ග බලපත්‍රය අවලංගුවන අතර, එම බස් රථ නැවත ධාවනයට එක් කිරීමේදී මගී සේවා බලපත්‍රය යාවත්කාලීන කිරීමේදී බලපත්‍රකරු පැරණි බස් රථයම ධාවනයට යොදවන්නේ නම් රු.30,000 ක ගාස්තුවක් ද නව බස් රථයක් යොදවන්නේ නම් රු. 60,000 ක ගාස්තුවක්ද අධිකාරියට අයවිය යුතු වුවත්, 2018 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ එම ගාස්තු අයකර ගැනීමෙන් තොරව බස් රථ 151 ක් ධාවනයට එක් කිරීමට අධිකාරියේ අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දින දක්වා බස් රථ හිමියන් 151 ක ගෙන් අයවිය යුතු හිඟ ආදායම රු. මිලියන 3 ක් වසර 02 ත් 08 ත් අතර කාලයක සිට අය කර ගෙන නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | බලපත්‍ර ගාස්තු විධිමත්ව හා කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ධාවනය සඳහා නිකුත් කර ඇති මාර්ග බලපත්‍රවල අයිතිය බලපත්‍රලාභීන් විසින් වෙනත් පාර්ශවයකට පැවරීමේදී රු.100,000 ක ගාස්තුවක් අධිකාරිය විසින් අයකරනු ලැබේ. එලෙස 2018 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ බලපත්‍ර 31 ක අයිතිය වෙනත් පාර්ශවයකට පවරා ඇතත්, එලෙස අයවිය යුතු ගාස්තුව රු. මිලියන 2 ක් අයකර ගැනීමකින් තොරව බලපත්‍ර අයිතිය සංශෝධනය කිරීමට කටයුතු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද ලැබිය යුතු හිඟ ගාස්තු අය නොවී පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | වෙනත් පාර්ශවයන් වෙත පවරා තිබූ හිඟ බලපත්‍ර ගාස්තු කඩිනමින් අයකර ගැනීමටත් ගාස්තු අය කිරීමෙන් තොරව සංශෝධන කළ නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

### 1.5.8.1.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අධිකාරිය සතු කඩ කාමර 247 න් කඩ කාමර 175 ක කඩකුලී රු. මිලියන 56 ක් හිඟව පැවති අතර ,එම ශේෂයෙන් වසර 01ට අඩු කාලයක්, වසර 01ත් 03 ත් අතර කාලයක් සහ වසර 03 ට වැඩි කාලයක සිට පැවත එන පිළිවෙළින් රු. මිලියන 14 ක්, රු. මිලියන 20 ක සහ රු. මිලියන 21 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හිඟ කුලී ප්‍රමාණය අවම කර ගැනීම සඳහා ක්‍රමවත් අය කර ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව. | හිඟ කඩ කාමර කුලී අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරියට අයත් කඩකාමර 247 අතුරින් කඩකාමර 41 ක් වසර 02 සිට වසර 10 කාලයක සිට ව්‍යාපාර කටයුතු සඳහා බදු හෝ කුලී ගිවිසුමකට යටත්ව වෙනත් පාර්ශවයන් වෙත ලබාදී නොතිබුණි . තවද බදු දී ඇති කඩ කාමර 206 න් කඩ කාමර 75 ක් සම්බන්ධයෙන් ගිවිසුම්ගත නොවීම හේතුවෙන් ඒ සඳහා වූ කුලීය අයකර ගැනීමට හැකි | ප්‍රයෝජනවත් ආදායම් මාර්ග බවට පත් කිරීමේ අරමුණින් බදු දීම සඳහා විකල්ප ක්‍රියා මාර්ග අඛණ්ඩව ගෙන යමින් පවතින බව. | හිඟ කඩ කුලී හා අධිභාර අය කර ගැනීමටත් හා බදු හිමියන් සමඟ ගිවිසුම්ගත වීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වී නොතිබුණි .තවද වසර 05කට වැඩි කාලයක සිට නඩු කටයුතු සිදු කරන කඩකාමර 30 ක් සඳහා අයවිය යුතු හිඟ කඩකුලී රු. මිලියන 35 ක් හා අධිභාර රු. මිලියන 2 ක් සමාලෝචිත වර්ෂය වන විටත් අයවී නොතිබුණි. | | |
| (ඇ) | අධිකාරිය විසින් එහි සේවය කරනු ලබන සේවකයින් 489 දෙනෙකුට අදාළව පසුගිය වසර 6 ක කාලය තුළ එකතුව රු. මිලියන 2,050 ක වැටුප් සහ දීමනා ගෙවීම් සිදු කර තිබුණු අතර, එම ගෙවීම් සඳහා Government Payroll System (GPS) භාවිතා නොකිරීම හේතුවෙන් එම ගෙවීම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් පද්ධතිමය පාලනයක් නොතිබුණි. තවද, සේවකයින් වෙත වැටුප් පත්‍රිකාද ලබා දී නොතිබුණි. අමාත්‍යාංශය විසින් Government Payroll System සම්බන්ධ පුහුණුවක් ලබාදී තිබුණ නමුත් එය ක්‍රියාත්මක කිරීමට අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි. | GPS පද්ධතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බව. | GPS පද්ධතිය මඟින් වැටුප් සැකසීම ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඈ) | අධිකාරියේ සේවකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් කාලෝචිතව පරීක්ෂා නොකිරීම හේතුවෙන් 1992–2019 වර්ෂවල බඳවාගත් සේවකයින් 89 දෙනෙකු ව්‍යාජ හා කූඨ ලේඛන භාවිතා කර සේවයට බැඳී තිබුණු බව අනාවරණය විය. නීතිමය ප්‍රතිපාදන තිබියදීත් ඔවුන්ට එරෙහිව නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර ඉන් 73 දෙනෙකු තවදුරටත් සේවයේ නිරතව සිටින අතර, ඔවුන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නොතිබුණි. | සේවකයින් තිදෙනෙකුගේ හැර අනෙකුත් සියලුම සේවකයින්ගේ සහතික පත්‍ර සනාථ කර ගැනීමේ කටයුතු මේ වන විට අවසන් බව. | ව්‍යාජ ලේඛන භාවිතා කර සේවයට බැඳුනු සේවකයින් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. මිලියන 54 ක් වටිනාකම වූ බස් නැවතුම්පොලවල් භෞතිකව නොමැති බව හඳුනාගෙන වසර 03 කට අධික කාලයක් ගත වී තිබුණද ඒ පිළිබඳව පළාත් | වත්කම් විවිධ අවස්ථාවලදී භෞතිකව ඉවත් කර තිබුණද, ඊට අදාළ පිරිවැය සහ සමුච්චිත ක්ෂයවීම් මූල්‍ය පොත්වල නිවැරදිව ගළපා නොතිබුණු අතර පළාත් භාණ්ඩාගාරයේ | බස් නැවතුම් පොළ වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන මුල්‍ය ප්‍රකාශන වලින් ගැලපීමට කටයුතු කර නොතිබුණි. | අනුමැතිය ලද සැනින්, මෙම පැරණි ශේෂයන්ට අදාළ භෞතිකව නොපවතින සියලුම වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර ගිණුම් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව | |
| (ඊ) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.1.6 (V) වගන්තිය ප්‍රකාරව වාහනයක් අනුයුක්ත කළයුතු බවට සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ගනු ලබන තීරණ මත අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල ජ්‍යෙෂ්ඨ නිලධාරින් සඳහා අදාළ අනුමැතින් මත පමණක් නිල වාහන පහසුකම් ලබාදීමේ හැකියාව පවතින අතර, මීට අමතරව 2016 නොවැම්බර් 01 දිනැති බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක 01/2016 (i) පාලන චක්‍රලේඛයේ 1.2.1 ප්‍රකාරව නිල වාහන භාවිතා කිරීමට හිමිකම ඇත්තේ ඒ සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 ප්‍රකාරව සුදුසුකම් ලබන නිලධාරින්ට පමණි. එසේ වුවද, එලෙස අනුමැතියක් ලබා ගැනීමකින් තොරව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) වෙත 2017 සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ නිල වාහනයක් ලබා දී රු. මිලියන 3 ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි. | නිල වාහන අනුයුක්ත කිරීම සහ භාවිතය සම්බන්ධයෙන් මාණ්ඩලික පත්‍රිකා 1629 මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි. මේ වන විට නිසි අනුමැතීන් සහිතව එම කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව නිල වාහන හා ඉන්ධන දීමනා ලබා දීමට කටයුතු කළ යුතු අතර, ඊට පටහැනිව අනුමැතිය ලබාදුන් නිලධාරින් සම්බන්ධව පරීක්ෂණ සිදු කොට එම නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | යම් නිලධාරියෙකු විසින් නිල වශයෙන් නිල වාහන භාවිතා කිරීම සඳහා හිමිකම් ලබන තනතුරක වැඩ බැලීම සිදු කරන්නේ නම් එම හිමිකම ඔහු සතුවන අතර, එවන් තනතුරක රාජකාරී ඉටු කිරීමට පත් කරනු ලබන නිලධාරියෙකු සඳහා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත එම හිමිකම ලබාගත යුතු වුවද, අධිකාරියේ නියෝජ්‍ය | නිල වාහන අනුයුක්ත කිරීම සහ භාවිතය සම්බන්ධයෙන් මාණ්ඩලික පත්‍රිකා 1629 මගින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි. මේ වන විට නිසි අනුමැතීන් සහිතව එම කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව නිල වාහන හා ඉන්ධන දීමනා ලබා දීමට කටයුතු කළ යුතු අතර, ඊට පටහැනිව අනුමැතිය ලබාදුන් නිලධාරින් සම්බන්ධව පරීක්ෂණ සිදු කොට එම නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

සාමාන්‍යාධිකාරී (මූල්‍ය) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරුවල වැඩ බලන නිලධාරීන් විසින් එලෙස අනුමැතියක් ලබා ගැනීමකින් තොරව 2017 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින වූ විගණිත දින දක්වා වසර 08 කට අධික කාලයක් නිලවාහන භාවිතා කර තිබුණි. 2017 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ එලෙස අනුමැතියක් නොමැතිව පිළිවෙලින් එම තනතුරු සඳහා රු. මිලියන 3 ක් බැගින් ඉන්ධන දීමනා හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) වෙත රු. මිලියන 2 ක ප්‍රවාහන දීමනාවක් වශයෙන් එකතුව රු. මිලියන 8 ක් ගෙවා තිබුණි.

**1.5.8.1.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සතු මාලඹේ බස් නැවතුම්පල භූමියේ කඩකාමර 21 ක් තක්සේරු කිරීමකින් තොරව වසර 20 කට අධික කාලයක් මාසිකව රු. 1,646 සිට රු.2,018 දක්වා වූ ඉතාමත් අඩු මුදලකට කුලියට ලබා දී තිබුණි. ඉන් කඩකාමර 14 ක් බදුකරුවන් විසින් නැවත වසර 05 සිට 20 දක්වා කාලයක සිට රු.7,000 සිට රු. 60,000 දක්වා මාසික කුලියකට වෙනත් පාර්ශවයන් වෙත බදු දී තිබුණි. තවද, බොහොමයක් කඩකාමර සඳහා නීතිමය වශයෙන් කිසිදු අයිතියක් නොමැති පාර්ශව වෙත අයිතිය හුවමාරු වී තිබූ අතර එම පාර්ශව විසින් බදු දීමනාකරු ලෙස තවත් පාර්ශව සමග මාසිකව රු. 50,000 සිට රු. 60,000 දක්වා අධික මුදලක් අය කරමින් තැන්පතු මුදල් ලෙස රු. 300,000 දක්වා මුදල් ලබා ගනිමින් නීත්‍යානුකූල නොවන ලෙස අතුරු බදු ගිවිසුම්වලට එළඹ තිබුණ ද මේ සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දැනටමත් කඩ කාමර කිහිපයක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව හා ගිවිසුම් නවීකරණය සහ කුලී සංශෝධන ක්‍රියාවලීන් විධිමත් කරමින් පවතින බව. | කඩ කාමර විධිමත්ව තක්සේරු කර බදු දීමට කටයුතු කළ යුතු අතර ගිවිසුම් ප්‍රකාරව අතුරු බදු දීම් වැළැක්විය යුතුය. |

### 1.5.8.2 පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

#### 1.5.8.2.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 182 ක් වූ ව්‍යාපෘති 20 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 69 ක් වැය කර තිබුණි. එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබීම සහ ව්‍යාපෘතිවල තිබූ අඩුපාඩු හා දුර්වලතා නිසා අධිකාරියට රු. මිලියන 109 ක මුදලක් ලබාගැනීමට නොහැකි වී තිබුණි. | අදාල ආයතන සමඟ සාකච්ඡා කර මුදල් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව. | ව්‍යාපෘතිවල අඩුපාඩු කඩිනමින් සකස් කිරීමටත්, හිඟ මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) යටතේ අධිකාරියේ කළුතර විධායක ඉංජිනේරු කාර්යාලයේ පූර්ණ අධීක්ෂණය යටතේ ඉටුකරන ලද ඇස්තමේන්තු වියදම රු. මිලියන 16 ක් වූ ව්‍යාපෘති 03 ක් නියමිත ප්‍රමිතියෙන් යුතුව හා අදාල ඇස්තමේන්තුවලට හා සැලසුම්වලට අනුකූලව සිදුකර නොතිබීම මත වියදම ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත බිල්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිවල ප්‍රමිතිය සඳහා වූ ගැටළු මත බිල්පත් ඉදිරිපත් කිරීමට නොහැකි බව. | ප්‍රමිතියට අනුව ව්‍යාපෘති ඉටු නොකිරීම පිළිබඳ සහ ව්‍යාපෘති අධීක්ෂණය කළ නිලධාරීන් පිළිබඳව පරීක්ෂණ සිදු කර එම නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

#### 1.5.8.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යාපන අමාත්‍යාංශය සතු ව්‍යාපෘති 04 ක් සඳහා රු. මිලියන 32 ක් ද සෞඛ්‍ය අමාත්‍යාංශය සතු ව්‍යාපෘති 11 ක් සඳහා රු. මිලියන 96 ක් ද අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සතු ව්‍යාපෘති 03 ක් සඳහා රු. මිලියන 54 ක් ද මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සතු ව්‍යාපෘති 03 ක් සඳහා රු. මිලියන 57 ක් ද වශයෙන් එකතුව රු. මිලියන 239 ක මුදලක් සේවා දායක ආයතනයෙන් ලද මුදල් ඉක්මවා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වැයකර තිබුණි. | මෙම වර්ෂයේ වැඩ අවසන් කර මුදල් ලබා ගැනීමට දෙපාර්ශවය එකඟ වී ඇති බව. | කඩිනමින් වැඩ අවසන් කර අඩුපාඩු නිවැරදි කර වැඩිපුර දරන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.8.3 සමූපකාර අරමුදල

#### 1.5.8.3.1 අරමුණුවලින් බැහැර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1973 සමුපකාර රීති මාලාව ප්‍රකාරව අරමුදලෙහි මුදල් සමුපකාර අධ්‍යාපන, ව්‍යාපෘති හා ප්‍රචාරක වැඩ, සමුපකාර සමිතිවල කළමණාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම හා සමුපකාර සමිතිවලට උපකාර කිරීම සඳහා යොදා ගතහැකි වුවද, ඊට පටහැනිව 2011 සිට 2025 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ විදේශ සංචාර, සේවක විශ්‍රාම වැටුප් අරමුදලේ බදු කුලී වියදම්, සමාලෝචන මණ්ඩල දීමනා, සමුපකාර මණ්ඩල දීමනා, සමුපකාර දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා වත්කම් මිල දී ගැනීම, විශ්‍රාම වැටුප් අරමුදලේ පරිගණක නිලධාරි දීමනා ඇතුළු අරමුදලේ අරමුණු වලින් බැහැර කාර්යයන් වෙනුවෙන් රු. මිලියන 61 ක මුදලක් යොදාගෙන තිබුණි. | අමාත්‍යාංශ ලේකම් විසින් 2009 ජනවාරි 16 දිනැතිව අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) අමතා ඇති ලිපිය ප්‍රකාර අරමුදල වැය කළ හැකි ආකාරය පිළිබඳ දැක්වෙන උපදෙස් මාලාවට අනුව කටයුතු කළ බව. | සමූපකාර අරමුදලේ රීතිවලට අනුකූල වන වියදම් පමණක් දැරීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.8.3.2 මෙහෙයුම් අකාර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) බස්නාහිර පළාත් සභාවේ සමුපකාර සමිති සංශෝධිත ප්‍රඥප්තිය ප්‍රකාර සෑම ලියාපදිංචි සමිතියක්ම සමුපකාර රෙජිස්ට්‍රාර් විසින් නියම කරන ලද පරිදි සමිතියේ වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 10 කට වැඩි නොවන සහ රු. 5 කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා ගෙවිය යුතු වුවත්, කොළඹ,ගම්පහ හා කළුතර සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කොට්ඨාශ තුනෙහි සමිති 1,124 ක් 2025 දෙසැම්බර් මස 31 දිනට රු. මිලියන 1,001 ක මුදලක් ගෙවා නොතිබුණි. | 2026 ජනවාරි 01 දින වන විට සමුපකාර අරමුදල් දායකය සඳහා රු. 73,931,399 ක් අය කර ඇති බව හා ප්‍රඥප්තිය සංශෝධනය කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ණය ආපසු අයකර ගැනීම සඳහා නිශ්චිත ලිඛිත කොන්දේසි හා ඇප සුරක්ෂණ පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් සකස් කර අනුගමනය කිරීමෙන් තොරව සමූපකාර අරමුදලින් සමූපකාර සමිති සඳහා වර්ෂ 03 ත් 05 ත් අතර, ගෙවීම් කාලයකට යටත්ව එක් සමිතියකට රු. මිලියන 25 දක්වා ණය ලබා දී තිබුණි. තවද, සමූපකාර අරමුදලේ දායක මුදල් නොගෙවා පැහැර හැර ඇති සමූපකාර සමිති සඳහාද ණය ලබා දී තිබුණි. ඒ අනුව 2025 දක්වා කිසිදු ඇප සුරක්ෂණයක් ලබා ගැනීමෙන් තොරව සමූපකාර සමිති 129 ක් සඳහා ද රු. මිලියන 1,089 ක ණය ලබා දී තිබූ අතර 2025 දෙසැම්බර් 31 දිනට සමස්ත ලැබිය යුතු ණය ශේෂය රු. මිලියන 584 ක් විය. | මෙම ණය ගෙවා අවසන් කරන ලෙසත්, නොමැති නම් නීතිමය පියවර ගන්නා බව දන්වා යවා ඇති අතර මූල්‍ය අර්බුදයට ලක්ව ඇති ගම්පහ දිස්ත්‍රික්කයේ සමිති ගෙන්වා කල්පසු ණය සම්බන්ධව සාකච්ඡා කිරීමට නියමිත බව. | ණය මුදල් ලබා දීම හා ණය ආපසු අයකර ගැනීම සඳහා විධිමත් පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු අතර අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කළ යුතුය. |

**1.5.8.4 සමූපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදල**

**1.5.8.4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාතේ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීතිවලට පටහැනිව 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වයස අවුරුදු 56 ඉක්මවූ පළාත් සමූපකාර විශ්‍රාම වැටුප් අරමුදලේ සේවකයින් 211 දෙනෙකුට සියයට 40 කට වඩා වැඩි ප්‍රතිශතයකින් විශ්‍රාම වැටුප් ගෙවා තිබීම සහ වාරික හා වයස පදනම් කරගෙන ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ප්‍රතිශතයට වඩා සියයට 48 සිට සියයට 78 ක් දක්වා වැඩි ප්‍රතිශතයකින් විශ්‍රාම වැටුප් ගෙවීම හේතුවෙන් 2022 ඔක්තෝබර් 01 දින දක්වා එකතුව රු. මිලියන 66 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | 211 දෙනාගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කර ගෙවීමට පාලක මණ්ඩලය තීරණය කර සංශෝධිත විශ්‍රාම වැටුප් ගෙවමින් පවතින බව හා එම සංශෝධනය සම්බන්ධයෙන් විශ්‍රාමිකයන් 39 දෙනෙකු නඩු පවරා ඇති බව. | බස්නාහිර පළාතේ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.8.5 කර්මාන්ත සංවර්ධන අධිකාරිය

#### 1.5.8.5.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මිහිලක් පලතුරු හා කෘෂි නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය හා ටින් මාළු සැකසීමේ ව්‍යාපෘතිය සඳහා එළවළු, පලතුරු, සුදු සීනි, ඉන්ධන, ගෑස් හා උපකරණ මිලදී ගැනීමේදී සැපයුම්කරුවන් ලියාපදිංචි කර එමඟින් මිලදී ගැනීමකින් තොරව, හදිසි මිලදී ගැනීම් ලෙස 2023 ජනවාරි මස සිට 2025 දෙසැම්බර් මස දක්වා කාලය තුළ අධිකාරියේ අධ්‍යක්ෂවරයා හා ව්‍යාපෘති සාමාන්‍යාධිකාරිවරයා අවස්ථා 158 කදී රු. මිලියන 9 ක අත්තිකාරම් ලබාගෙන රු. මිලියන 8 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.තවද මෙම රු. මිලියන 8 ක මිලදී ගැනීම් සඳහා විධිමත් භාණ්ඩ ලැබීමේ තුණ්ඩු (GRN) නිකුත් කර නොතිබු බැවින් අමුද්‍රව්‍ය හා භාණ්ඩ ගබඩාවට ලැබූ බවට සනාථ කරගත නොහැකි විය. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව ව්‍යාපෘතියේ මිලදී ගැනීම් සිදු කළ යුතු අතර මිලදී ගැනීම් සඳහා විධිමත් භාණ්ඩ ලැබීමේ තුණ්ඩු (GRN) නිකුත් කර අමුද්‍රව්‍ය හා භාණ්ඩ ගබඩාවට ලැබුණු බවට සනාථ කරගත යුතුය. |
| (ආ) | කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ටින් මාළු බෙදාහැරීම හා අලෙවිය සඳහා මහනුවර, වැලිමඩ හා අම්පාර යන ප්‍රදේශවල අලෙවි නියෝජිතයින් තිදෙනෙකු සමඟ 2024 වර්ෂයේදී කිසිදු ඇප මුදලක්, බැංකු සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව ගිවිසුම් 03 කට එළඹ රු. මිලියන 19 ක් වටිනා ජැක් මැකරල් ටින් 31,200 ක් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමකින් තොරව අධිකාරියේ අධ්‍යක්ෂකවරයා විසින් ණය පදනම මත ලබා දී තිබුණි. ණය පියවීම සඳහා අලෙවි නියෝජිතයන් තිදෙනා විසින් ලබාදී තිබූ රු. මිලියන 18 ක් වටිනා චෙක්පත් 05, බැංකු ගිණුම වසා දමා තිබීම හා චෙක්පත් සඳහා මුදල් ගෙවීම් නතර කරන ලෙස බැංකුවට උපදෙස් ලබාදී තිබීම හේතුවෙන් අගරු වී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව එකඟ වූ පරිදි මුදල් ගෙවීම් පැහැර හරින ලද හා ලබාදුන් චෙක්පත් අගරුවීමට සලස්වන ලද නියෝජිතයන් සම්බන්ධව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලද බව. | ණයට විකිණීම හා ණය මුදල් නැවත අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. අදාළ ගනුදෙනු අනුමත කළ නිලධාරීන් ගෙන් අලාභය පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පූර්ව සැලසුමකින් තොරව විශාල පිරිවැයක් දරා මිලදී ගන්නා ලද රු. මිලියන 2 ක් වටිනා විදුරු බෝතල්, කාටුන් හා ලේබල් තොග අයිතම 106,859 ක් වසර 03 කට අධික කාලයක් නිකුත් නොවී වල්පිට මිහිලක් කර්මාන්ත ශාලා පරිශ්‍ර ගබඩාවේ පැවතුණි. | කර්මාන්ත ශාලාවේ කටයුතු ක්‍රමයෙන් නැවැත්වීමට සිදුවී මෙන් ඇණවුම් භාරගැනීම නැවැත්වීම සිදුවූ අතර නිෂ්පාදන ක්‍රියාවලිය අඩපණ වීම තුල අදාල තොග අයිතම නිකුත් නොවූ බව | ඉතිරි තොග නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට හෝ සුදුසු කාර්යයන් සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

**1.5.8.5.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කල මිහිලක් කෘෂි නිෂ්පාදන සැකසීමේ ව්‍යාපෘතිය හා ටින් මාළු සැකසීමේ ව්‍යාපෘතිය වඩා ලාභදායී ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා 2022 සැප්තැම්බර් මස කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 50 ක් වූ යන්ත්‍ර සූත්‍ර හා රු. මිලියන 9 ක් වූ අමුද්‍රව්‍ය හා නිමි තොගද සමඟ පවරා තිබුණි. නමුත් ටින් මාළු සැකසීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම 2023 නොවැම්බර් දක්වා වසරකට අධික කාලයක් ප්‍රමාද වී තිබූ අතර ඒ වන විට ඇතැම් යන්ත්‍ර සූත්‍රවල වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි. රජය විසින් නව ඉදිකිරීම් ප්‍රමාද කිරීමට හා අත්හිටුවා තිබියදී ව්‍යාපෘතිය සඳහා ටින් මාළු නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල ඇතුළු නව ඉදිකිරීම් සඳහා රු. මිලියන 181 ක් වැය කර තිබුණි. 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාලය තුල කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන මත රු. මිලියන 169 ක් ද මාර්ග ප්‍රවාහන අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන රු. මිලියන 248 ක් ද ඇතුළුව 2025 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා දරා තිබූ මුළු වියදම රු. මිලියන 417 ක් විය. එසේ වුවද, 2025 හා 2024 වසර 02 ක කාලය තුළද රු. මිලියන 88 ක අලාභයක් ලබා තිබූ අතර 2025 දෙසැම්බර් 31 දිනට මිහිලක් නිෂ්පාදන | ව්‍යාපෘතියේ වාණිජ වශයෙන් නිෂ්පාදන අලෙවිය සිදු කිරීමේදී ප්‍රායෝගිකව පොදුවේ මුහුණ දෙන ගැටළු හා බාධක රාශියක් හේතුවෙන් අපේක්ෂිත ආකාරයට ලාභදායි ව්‍යාපෘතියක් ලෙස කටයුතු කිරීමට ගැටළු මතුවූ අතර ආණ්ඩුකාරතුමා සමග පැවති සාකච්ඡාවෙන් පසු කළමණාකරණ මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතිය තවදුරටත් පවත්වාගෙන යාම නවතා ඇත. මෙම ව්‍යාපෘතිය විධිමත් ක්‍රියාපටිපාටියක් මගින් පෞද්ගලික අංශයේ ව්‍යවසායකයකු වෙත දිගුකාලීන බදු පදනම මත ලබා දීමට කටයුතු කරමින් පවතන බව. | ව්‍යාපෘතිවල සම්පත් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට හා ව්‍යාපෘතියේ අරමුණු ළඟා කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විකිණීමෙන් ලැබිය යුතු රු. මිලියන 23 ක අය නොවී පවතින ණය ශේෂ ද විය. | | |
| (ආ) | වල්පිට මත්ස්‍ය කර්මාන්ත ශාලා භූමියේ රු. මිලියන 30 ක් වැය කරමින් ඉදිකළ අපජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයේ අවසන් කර යන්ත්‍ර හා උපකරණ ලබා දී ඇතත් වසර 2 කට අධික කාලයක් එය භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි. මෙම අපජල පවිත්‍රාගාරය නිසි පරිදි ක්‍රියාත්මක තත්ත්වයේ ඇති බව තහවුරු කිරීම සඳහා ටින් මාළු නිෂ්පාදනය අඛන්ඩව සිදුවිය යුතු වුවද, 2025 වර්ෂය තුල දී ටින් මාළු නිෂ්පාදනය අඛණ්ඩව සිදු කර නොතිබූ අතර 2026 අප්‍රේල් 10 දින සිට ටින් මාළු නිෂ්පාදන ව්‍යාපෘති කටයුතු නතර කර තිබුණි. | ව්‍යාපෘතියේ පැවති විවිධ ගැටළු හමුවේ ටින් මාළු නිෂ්පාදන ක්‍රියාවලිය සිදු නොවූ බැවින් අපජල පද්ධතිය භාවිතා නොවූ බව | ව්‍යාපෘතියේ පවතින ගැටළු නිරාකරණය කරගෙන ව්‍යාපෘතියේ වත්කම්වලින් ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.8.5.3 හඳුනාගන්නා ලද පාඩු**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂයේ නිෂ්පාදිත 2027 වර්ෂයේ කල් ඉකුත්වීමට නියමිත ඒකකයක නිෂ්පාදන පිරිවැය රු.890 ක් වූ ජැක් මැකරල් ටින් 21,912 ක් සමාලෝචිත වර්ෂයේ එකක් රු.360 ත් රු.448 ත් අතර අගයකට ලංකා සතොස වෙත විකිණීම හේතුවෙන් මිහිලක් ව්‍යාපෘතියට රු. මිලියන 11 ක අලාභයක් සිදු වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | අලෙවි ක්‍රමවේද විධිමත් කළ යුතු අතර, නිෂ්පාදන පිරිවැය අවම කර වෙළඳපොළ තරගකාරීත්වය සමඟ කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2024 වර්ෂයේදි වල්පිට කෘෂි නිෂ්පාදන සැකසුම් ව්‍යාපෘතියට අයත් වටිනාකම රු. මිලියන 2 ක ජෑම්, ජූස් වර්ග, සෝස් වර්ග තොග අයිතම 5,520 ක් ද 2025 වර්ෂයේදී රු. මිලියන 1 ක මිහිලක් ව්‍යාපෘතියට අයත් ජෑම්, ජූස් බෝතල් 4,040 ක් ද කල් ඉකුත් වීම හේතුවෙන් රු. මිලියන 3 ක අලාභ සිදු වී තිබුණි. තවද, මෙම කල් ඉකුත් වූ තොග විගණිත දින වූ 2026 ජූනි 25 දින වන විටත් කර්මාන්ත ශාලා පරිශ්‍රයෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවරදි ගණනයක් සිදුකල යුතු බැවින් ඒ සඳහා යම් ප්‍රමාදයක් සිදු වි ඇති අතර කඩිනමින් ඉවත් කිරීමට පියවර ගන්නා බව | නිෂ්පාදන කල් ඉකුත්වීමට පෙර ඒවා අලෙවි කිරීමට විධිමත් වැඩපිළිවෙළක් යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල ටින් මාළු සීල් කිරීමට යොදා ගන්නා කෑන් සීමර් යන්ත්‍රය හා රිටෝර්ට් යන්ත්‍ර බිඳවැටීම්, කල් ඉකුත් වීම් හේතුවෙන් හානි වූ තොග ආපසු එවුම් හා වෙනත් හේතුන් මත සැමන් ටින් 3,027 කට හානි සිදු වීමෙන් මිහිලක් ව්‍යාපෘතියට රු. මිලියන 2 ක අලාභ සිදු වී තිබුණි. | කෑන් සිමර් යන්ත්‍රයේ තාක්ෂණ දෝෂ මත ටින් සිල් නොවීම මත එම නිෂ්පාදන වෙළඳපොලට අලෙවි කිරීම කළ නොහැකි වූ අතර මීගමුව ධීවර සංස්ථා වෙළඳසැල තුල තිබුණු තොග මලබැඳීම සිදුවීම හේතුවෙන් පාරිභෝගිකයන්ට අලෙවි කිරීමට නොහැකි වූ බව | තොග හානි අවම කර ගැනීමට විධිමත් පියවර ගත යුතු අතර එම තොග විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.9 ශීර්ෂය 108 - අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය

#### 1.5.9.1 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය දක්වා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලද ප්‍රතිපාදන භාවිතා කර හෝමාගම කනිෂ්ඨ විද්‍යාලයක අඩි 70x25 ප්‍රමාණයේ තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රු. මිලියන 3 ක පිරිවැයක් දරා පළමු මහල දක්වා නිමකර අතරමඟ නවතා දමා තිබූ නමුත් 2025 වාර්ෂික පළාත් සභා ක්‍රියාත්මක වැඩසටහන් යටතේ උක්ත ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරගෙන එම වැඩ කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේ ගොඩනැගිලි අවශ්‍යතාවය ප්‍රමුඛතා කිරීමේදී අත්‍යාවශ්‍ය වූ වෙනත් පාසල්වල ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හේතුවෙන් මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් කළ නොහැකි වූ බව. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරවාගෙන ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ළඟම පාසල හොඳම පාසල වැඩසටහන යටතේ ලද ප්‍රතිපාදන මත 2018 වර්ෂයේ වැඩ ආරම්භ කරන ලද කැලණිය අඹගස්පිටිය විද්‍යාලයක ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා අත්තිවාරම් යොදා කම්බි කණු ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 3.44 ක් වැයකළ පසු උක්ත ව්‍යාපෘතියේ වැඩ කටයුතු අතරමග නැවතී තිබුණු අතර අත්තිවාරම් හා කම්බි කණු දිරාපත් වෙමින් පැවතුණි. 2018 සිට 2025 වර්ෂය දක්වා වසර 07 ක කාලයක් | පාසලේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව වඩාත් ඵලදායී ලෙස පවතින ගොඩනැගිලි උපයෝජනය කර ගැනීමට හැකි වන පරිදි අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලද බව. | ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබුණු පිරිවැය ඵලදායීව උපයෝජනය වන පරිදි සුදුසු වෙනත් ව්‍යාපෘතියකටයෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| එතෙක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබුණු පිරිවැය ඵලදායිව උපයෝජනය වන සුදුසු වෙනත් ව්‍යාපෘතියක් හෝ ඉටු නොකිරීම හේතුවෙන් අත්තිවාරම් සැකසීම වෙනුවෙන් එතෙක් වැයකර තිබුණු මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | | |

**1.5.9.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහරගම පොල්වත්ත ක්‍රීඩා ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ලේ නේවාසික පහසුකම් සඳහා කාමර සහිත පළමු මහලේ වැඩ රු.මිලියන 33.3 ක පිරිවැයක් දරා නිම කිරීමෙන් පසු 2023 සැප්තැම්බර් 18 දින පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දී තිබූ අතර 2025 පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ එම නේවාසිකාගාරය සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීම සඳහා රු.මිලියන 02 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණ ද අදාළ මිලදී ගැනීම සිදුකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබීම හේතුවෙන් නේවාසිකාගාරය භාවිතයට ගැනීමට හැකි වී නොතිබුණි. | මේ වන විට භාණ්ඩ කොටසක් මිලදී ගෙන ඇති අතර ඉතිරි භාණ්ඩ ඇණවුම් කළ නමුත් තෝරා ගත් ආයතනය විසින් භාණ්ඩ ලබා දීමට අපොහොසත් වූ බව. | උපකරණ කඩිනමින් මිලදී ගෙන නේවාසිකාගාරය භාවිතයට ගැනීමට පියවර ගත යුතුය. |

**1.5.9.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 වර්ෂයේ නිෂ්පාදිත MITSUBISHI වර්ගයේ EAZASRHER GALANT මාදිලියට අයත් මොටර් රථයක් 2011 වර්ෂයේ සිට අමාත්‍යාංශයේ පරිහරණයට ලබා දී තිබිය දී 2016 අප්‍රේල් 16 දින එහි සහකාර ලේකම් විසින් අනුමැතියකින් තොරව මෝටර් රථය පදවාගෙන යාමේදී දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව පිවිසුමේදී හදිසි ගිනි ගැනීමකට ලක් වී හානියට පත්ව තිබුණි. | ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති බව හා කමිටුවේ නිර්දේශ ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | පරීක්ෂණ කඩිනමින් නිම කර එහි නිර්දේශ අනුව කටයුතු කළ යුතුය.. |

| | | |
|---|---|---|
| එහි සම්පූර්ණ අලාභය වන රු. මිලියන 2.75 ක වටිනාකමින් මෝටර් රථය පදවාගෙන ගිය එවකට හිටපු සහකාර ලේකම්ගෙන් අයවිය යුතු රු.මිලියන 2.6 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගෙන නොතිබුණි. | | |

**1.5.9.4 මානව සම්පත් කලමනාරකණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාසල් කාර්ය මණ්ඩලවල විදුහල්පතිවරු, ගුරුභවතුන් පිළිවෙලින් 347 ක හා 5,066 ක පුරප්පාඩු පැවැති අතර, සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය 681 ක පුරප්පාඩු පැවතුණි. | කාර්යමණ්ඩල වාර්තා නිවැරදි බව හා බඳවා ගැනීම් නතර කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ අවශ්‍ය පරිදි සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.10 ශීර්ෂය 109 - ප්‍රධාන ලේකම් කාර්යාලය**

**1.5.10.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩසටහන් 06 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් රු. බිලියන 16 ක මුදලක් ලැබී තිබූ අතර, එම මුදලින් පළාත් සභාවේ ආයතන වෙත රු. මිලියන 12,530 ක් නිකුත් කර තිබුණි. ආයතන විසින් වසර අවසානයේ අදාළ වැඩසටහන්වලට අදාළ ව්‍යාපෘති සඳහා වියදම් නොකර රු. මිලියන 396 ක් නැවත පළාත් භාණ්ඩාගාරය වෙත පියවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් සංවර්ධන ව්‍යාපෘති සඳහා පළාත් සභාව වෙත ලැබී තිබුණු මුදලින් රු. මිලියන 3,741 ක් එනම්, සියයට 23 ක් ඉතිරි වී තිබුණි. | 2025 වර්ෂයේ ප්‍රාග්ධන ව්‍යාපෘති අවසන් කිරීම ප්‍රමාද වීම මෙම ඉතිරිවීම්වලට හේතු වී ඇති බව. | භාණ්ඩාගාරයෙන් ව්‍යාපෘති/ වැඩසටහන්වලට වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල් යොදා ගෙන නියමිත වේලාවට ව්‍යාපෘති අවසන් කිරීමට ඉදිරියේදී කටයුතු කළ යුතුය. |

**1.5.10.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ජේදය | රජයේ නිලධාරීන්ට රජයේ නිවසක් ලබා දීම කළ හැකි නමුත් මාසිකව නිවාස දීමනාවක් ගෙවීමට කිසිදු හැකියාවක් නොමැති වුවද, නිල නිවාස ඉදිකරන තෙක් තාවකාලික ගෙවීමක් ලෙස හිටපු ප්‍රධාන ලේකම් වෙත රු. 50,000 බැගින් සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත රු. 30,000 බැගින් වන පරිදි 2011 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා නිලධාරීන් 25 දෙනෙකු වෙත රු. මිලියන 28 ක නිල නිවාස දීමනාවක් ගෙවා තිබුණි. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ගෙවා ඇති බව. | මෙලෙස නිලධාරීන්ට නිවාස දීමනා ගෙවීමට නොහැකි අතර ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 29 දිනැති හා අංක 13/2008(VI) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පළාත් ප්‍රධාන ලේකම් සඳහා මසකට ඉන්ධන ලීටර් 220 ක් හා අතිරේක ලේකම් හෝ ඊ හා සමාන නිලධරයන්ට මසකට ඉන්ධන ලීටර් 165 කට සමාන ඉන්ධන දීමනාවක් පමණක් අනුමත වී තිබියදී ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ප්‍රධාන ලේකම් සඳහා ඉන්ධන ලීටර් 100 කින් හා අනෙකුත් නිලධාරීන් සඳහා ඉන්ධන ලීටර් 50 කින් ඉන්ධන දීමනාවේ සීමාවන් වැඩි කර 2012 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා නිලධාරීන් 41 දෙනෙකු සඳහා වැඩිපුර රු. මිලියන 19 ක දීමනා ගෙවා තිබුණි. | ආණ්ඩුකාර අනුමැතිය මත ගෙවා ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අය කළ යුතුය. |

#### 1.5.10.3 ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මට අනුව පළාත් සභාවේ ව්‍යාපෘති සඳහා රු. මිලියන 14,416 ක මුදලක් අනුමත වී තිබුණු අතර, එයින් රු . මිලියන 12,792 ක් පමණක් වැයකර තිබුණි. ව්‍යාපෘති 5,514 ක් අනුමත වී තිබුණද 2025 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් නිම කිරීමට හැකිව තිබුණේ ව්‍යාපෘති 5,337 ක් පමණි. සැලසුමට අනුව රු. මිලියන 2,125 ක ව්‍යාපෘති 177 ක් නිම කර නොතිබුණි. | අදාල අමාත්‍යාංශවලින් නිම කර නොතිබූ ව්‍යාපෘති 177 සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ලබා ගත් බව. | අනුමත ක්‍රියාකාරී සැළසුමට අනුව කටයුතු කළ යුතු අතර අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.10.4 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලයේ එකතුව රු. මිලියන 14 ක් වූ වත්කම් 39 ක ප්‍රමාණයක් අවශ්‍යතාවය ගැන නොසලකා 2018 වර්ෂයේදී මිලදී ගැනීම හේතුවෙන් ආපන ශාලාව තුළ ප්‍රයෝජනයට නොගෙන අවුරුදු 07 ක කාලයක සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | අපහරණය කිරීමට කටයුතු කරමින් පවතින බව. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට හෝ අවශ්‍යතාවය ඇති රජයේ ආයතනයකට ලබාදීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.10.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ සියලුම නිලධාරීන්ගේ තොරතුරු ඇතුළත් කර කළමනාකරණ තොරතුරු පද්ධතියක් වසරක් තුළ සකස් කිරීම සඳහා පිරිස් හා පුහුණු අංශය විසින් 2020 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගත වී තිබුණි. තවද, 2022 වර්ෂයේ සිට පුද්ගලයන් 4 දෙනෙක් වෙත තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා රු. 280,000 ක් බැගින් මාසිකව ගෙවා තිබුණි. 2026 අප්‍රේල් 30 දින වන විට | පරිපාලන කටයුතු සඳහා යොදා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරන බව. | තොරතුරු පද්ධතිය කඩිනමින් භාවිතයට ගත යුතුය. |

| | | |
|---|---|---|
| රු. මිලියන 21 ක මුදලක් ගෙවා තිබුණ නමුත් මෙම තොරතුරු පද්ධතියෙන් කිසිදු කාර්යයක් ඉටු කර ගැනීමට පළාත් සභාවට හැකි වී නොතිබුණි. | | |

**1.5.10.6 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහකාර ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) ලෙස කටයුතු කළ නිලධාරිණියට පශ්චාත් උපාධියක් ලබා ගැනීම සඳහා ජපානය වෙත යාමට 2017 ජූලි 10 දින සිට වසර 02 ක කාලයක් හා නැවත ආචාර්ය උපාධියක් සඳහා වසර 3 ක කාලයක් සඳහා වැටුප් සහිත නිවාඩු අනුමත කර තිබුණු අතර, පළමු බැඳුම්කරය අනුව වසර 9 ක අනිවාර්ය සේවා කාලයක් සේවය කළ යුතු බවට එකඟ වී තිබුණු නමුත් වසර 2 කුත් මාසයක් පමණක් සේවය කර තිබුණි. දෙවන බැඳුම්කරය අනුව අනිවාර්ය සේවා කාලය වසර 10 ක් සඳහා එකඟතාවය පලකර තිබුණු නමුත් 2024 ඔක්තෝබර් 07 දින සේවයට වාර්තා කර නැවත 2024 ඔක්තෝබර් 18 දින අනුමැතියකින් තොරව විදේශගත වී තිබුණි. අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකොට ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩකිරීමෙන් ගිවිසුමේ 18 වගන්තිය රජයට අයවිය යුතු බැඳුම්කර වටිනාකම වූ රු. මිලියන 4 නිලධාරිණියගෙන් අයකිරීමට හෝ එසේ නොමැතිනම් ඇපකරුවන් වෙතින් අයකර ගැනීමට අදාල නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අය කර ගත යුතු මුදල තීරණය කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර, කමිටු තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | ගිවිසුම් හා බැඳුම්කර ප්‍රකාර කටයුතු කර අදාල මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.10.7 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 3 (IV) වගන්තිය ප්‍රකාර වැටුප් දීමනා හා වෙනත් ගෙවීම් සම්බන්ධයෙන් මුදල් | ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ප්‍රකාරව දීමනා ගෙවා ඇති බව. | පනත හා චක්‍රලේඛ ප්‍රකාර දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය. |

විෂයභාර අමාත්‍යවරයාගේ රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන්ට අනුව ක්‍රියා කළ යුතුය. තවද, 2019 මාර්තු 29 දිනැති අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා තීරණය කිරීමේදී ජාතික වැටුප් කොමිෂන් සභාවෙන් හා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගත යුතු නමුත් ඊට පටහැනි ලෙස ප්‍රධාන ලේකම් කාර්යාලයේ විවිධ කමිටු 10 ක් සඳහා රු. මිලියන 19 ක දීමනා ගෙවා තිබුණි.

**1.5.10.8 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනවල ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටමේ තනතුරුවල පිළිවෙලින් 186 ක් 81 ක් හා 855 ක පුරප්පාඩු පැවතුණි. | කාර්ය මණ්ඩල වාර්තා නිවැරදි බව හා බඳවා ගැනීම් නතර කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ අවශ්‍ය පරිදි සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රඥප්ති මගින් පිහිට වූ ආයතනවල ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටමේ තනතුරුවල පිළිවෙලින් 25 ක, 35 ක හා 171 ක පුරප්පාඩු පැවැති අතර, ප්‍රාථමික මට්ටමේ තනතුරු 232 ක පුරප්පාඩු පැවතුණි. | කාර්යමණ්ඩල වාර්තා නිවැරදි බව හා බඳවා ගැනීම් නතර කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ අවශ්‍ය පරිදි සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂ අංක 110 - ඉංජිනේරු කාර්යංශය**

**1.5.11.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයයේ සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය වෙත බදු පදනමින් පවරා දී තිබුණු අවිස්සාවේල්ල රත්නපුර පාරේ පිහිටි අංක 99/04/ඩී දරන ඉංජිනේරු | ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත මේ සම්බන්ධයෙන් ලිපියක් යවා ඇති බව. | තක්සේරු වාර්තා අනුව නැවත ගිවිසුම් ගත වීමට හෝ පවරා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යාංශයේ ගොඩනැගිල්ල නැවත පවරා ගැනීමට කටයුතු කිරීමට හෝ එම ගොඩනැගිලි පරිශ්‍රය සබරගමුව බස් සමාගමට තවදුරටත් අත්‍යවශ්‍ය වන්නේ නම්, 2022 සැප්තැම්බර් 22 දිනැති තක්සේරු වාර්තාව පදනම් කරගෙන රු.70,000 ක මාසික කුළියකට ගිවිසුම්ගත වීමට හෝ නැවත පවරා ගැනීමට ප්‍රධාන ලේකම් විසින් දන්වා තිබුණු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර, රු.20,000 ක මාසික කුලියක් පමණක් ලබා ගනිමින් පැවතුණි. | | |
| (ආ) | ඉංජිනේරු කාර්යාංශය විසින් ලිපිගොනු කළමනාකරණ හා ක්‍රියාවලීන් ස්වයංක්‍රීයකරණ මෘදුකාංග පද්ධතිය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගැනීම සඳහා බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය වෙත 2018 හා 2021 වර්ෂවලදී රු. මිලියන 14 ක ප්‍රතිපාදන නිදහස් කර තිබුණි. බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ ආයතනය විසින් තරඟකාරී ලංසු කැඳවීම යටතේ ආයතනයක් තෝරාගෙන වැට් බදු රහිතව රු. මිලියන 18 ක මුදලකට 2018 දෙසැම්බර් 28 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. ගිවිසුම අනුව මෙම පරිගණක මෘදුකාංග පද්ධතිය 2019 අප්‍රේල් 20 දිනට පෙර සකස් කර භාරදිය යුතු නමුත් මේ වන විටත් වැඩ අවසන් කර භාරදීමට කටයුතු කර නොතිබුණි. | මේ වන තෙක්ද මෙය ඉංජිනේරු කාර්යාංශයේ භාවිතයට සුදුසු ලෙස ඵලදායි අයුරින් සකස් වී නොමැති බව. | මෘදුකාංග පද්ධතිය කඩිනමින් සකස්කරවාගෙන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.12 ශීර්ෂය 111 - ආදායම් දෙපාර්තමේන්තුව

### 1.5.12.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් සභාවේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව නීතිඥවරුන් විසින් ලියා සහතික කරනු ලැබූ ඔප්පුවල දෙවන පිටපත් සඳහා නියමිත පරිදි මුද්දර ගාස්තු ගෙවීම ප්‍රමාද කළ හා ගෙවීම් කර නොතිබූ මුද්දර ගාස්තු පිළිබඳ තොරතුරු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් එවා තිබුණ ද 2024 වර්ෂය තුළ ලියා සහතික කරන ලද රු. මිලියන 3,339 ක වටිනාකමැති ඔප්පු 816 කින් ඔප්පු 448 ක් හා 2025 වර්ෂය සඳහා රු.මිලියන 3,468 ක වටිනාකමැති ඔප්පු 675 න් ඔප්පු 506 ක් සම්බන්ධයෙන් කටයුතු අවසන් කර හිඟ මුද්දර ගාස්තු හා දඩ මුදල් අයකර ගැනීමට 2025 දෙසැම්බර් 31 දින දක්වාත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ ඔප්පු 410 ක් හා 2025 වර්ෂයේ ඔප්පු 465 ක් පමණක් ඉතිරිව ඇති බව හා ඒ සම්බන්ධයෙන් අය කටයුතු සිදු කරමින් පවතින බව. | මුද්දර ගාස්තු හා දඩ මුදල් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් හිමිකම් පැවරීම වෙනුවෙන් මුද්දර ගාස්තු අයකිරීමේදී ස්ථාපිත කර තිබෙන පාලන ක්‍රමවල දුර්වලතා හේතුවෙන් 2017 නොවැම්බර් 30 දිනැති අංක 738 දරන ඉඩම් පැවරීමේ ඔප්පුව වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 4 ක මුදල නොතාරිස්වරිය විසින් පෞද්ගලික පරිහරණයට ගෙන තිබුණි. මෙම මුදල හා ඒ සම්බන්ධයෙන් වූ දඩ මුදල සමඟ රු. මිලියන 8 ක් අයකර ගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 47142/5 දරන නඩුව ගොනුකර තිබුණු අතර, එම කාලවකවානුව තුළ අදාළ නොතාරිස්වරිය මියගොස් තිබීම හේතුවෙන් එම මුදල අයකර | හිඟ මුදල අය කර ගැනීම අධිකරණ ක්‍රියාවලිය ඔස්සේ සිදු වෙමින් පවතින බව. | මුද්දර ගාස්තු අය කිරීමට ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට මේ දක්වා හැකි වී නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අයත් ආදායම් සංකේත 07 කට අදාළ එකතුව රු.මිලියන 66.5 ක් වූ ආදායම් විධිමත් අනුමැතියකින් තොරව කපාහැර තිබුණි. | දෝෂ නිවැරදි කිරීම සඳහා කපා හැරීම් සිදු කර ඇති බව. | අදාළ ගැලපීම් නිවැරදි කර දෝෂ අවම වන පරිදි ගිණුම් සකස් කළ යුතුය. |
| (ඈ) | ආදායම් ශීර්ෂ 08 කින් සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 555ක හිඟ ආදායමක් පැවතුණි. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කිරීම කාර්යක්ෂමව සිදු කළ යුතුය. |

### 1.5.13 ශීර්ෂය 112 - පළාත් පාලන දෙපාර්තමේන්තුව

#### 1.5.13.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනතේ (317) වගන්තිය හා නගර සභා ආඥා පනතේ 198 වගන්තිය | පනතේ විධිවිධාන අනුව 2023 වර්ෂයේ මහා නගර සභා 5 ක් හා නගර සභා 7 ක් සඳහාත් 2024 වර්ෂයේ මහා නගර සභා 5 ක් හා නගර සභා 5 ක් වෙත අදාල වාර්තා යවා නොතිබුණි. | මහ නගර සභා 05 ට අදාළ වාර්තා 2026 ජූලි මස 30 දිනට පෙර කොළඹ දිස්ත්‍රික්කයේ වාර්තා 2026 ජූලි මස 30 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව හා පෑලියගොඩ නගර සභාව සහ මිනුවන්ගොඩ නගර සභාවෙහි, 198 වාර්තා 2023 හා 2024 වර්ෂවල එක් වාර්තාවක් ලෙස ඉදිරිපත් කර ඇති බව. | පළාත් පාලන කොමසාරිස්ගේ කාර්යභාරය අනුව මහා නගර සභා ආඥා පනත හා නගර සභා ආඥා පනත ප්‍රකාර සමීක්ෂණ වාර්තා කාලීනව යැවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයේ 54.6 | පළාත් පාලන ආයතන වල සිදු වූ අක්‍රමිකතා සම්බන්ධයෙන් වූ මූලික විමර්ශන 31 කට අදාලව විමර්ශන නිලධාරීන් පත්කර වසර 03 ඉක්ම වූ කාල පමාවක් සිදු වී තිබුණද 2025 දෙසැම්බර් 31 දින වන විටත් විමර්ශන කටයුතු අවසන් කර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පවතින නිලධාරීන්ගේ හිඟකම හා ඔවුනට පැවරී ඇති රාජකාරී ප්‍රමාණයේ විශාලත්වය මත මූලික විමර්ශන ඉටු කර වාර්තාව ලබා දීමට නියමිත කාල සීමාවට වඩා ප්‍රමාද වීමක් සිදු වන බව හා මූලික විමර්ශන කඩිනම් කර ගැනීමට විමර්ශන නිලධාරීන් දැනුවත් කර ඇති බව. | මූලික විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**1.5.13.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතනවල ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටමේ තනතුරුවල පිළිවෙලින් 204 ක් 138 ක් 2,168 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 3,993 ක පුරප්පාඩු පැවතුණි. | කාර්ය මණ්ඩල වාර්තා නිවැරදි බව හා බඳවා ගැනීම් නතර කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ අවශ්‍ය පරිදි සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.14 ශීර්ෂය 113 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**1.5.14.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය තුළ ලබා දෙනු ලබන අතුරු අග්‍රිම වර්ෂය අවසානයට පියවීමට කටයුතු කළයුතු වුවද, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රු. මිලියන 14 ක් ද ගම්පහ, හොරණ හා වතුපිටිවල මූලික රෝහල් සඳහා 2009 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ලබා දී තිබූ එකතුව රු. මිලියන 17 ක අතුරු අග්‍රිම ද පියවීමට කටයුතු කර නොතිබුණි. | නොපියවූ අග්‍රිමය වාර්ෂිකව ක්‍රම ක්‍රමයෙන් අඩුවන බවද දැනට පවත්නා හිඟ ශේෂය තවදුරටත් වර්ධනය වීමක් සිදු නොවන බව හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පියවීමට ඇති ශේෂය රු.මිලියන 14 ක් බව. | අතුරු අග්‍රිම නියමිත වේලාවට පියවීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | 2017 දෙසැම්බර් 31 දිනැති අංක 02/2017 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ වත්කම් කළමනාකරණය චක්‍රලේඛයේ 02 වන වගන්තිය ප්‍රකාර රජයට අයත් සෑම වාහනයක්ම එම වාහනය අයිති ආයතනය නමින් ලියාපදිංචි කර තිබිය යුතු වුවත්, කොළඹ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයේ පවතින වාහන 42 ක් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | ලියාපදිංචිය සිදු කිරීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව ආයතනය නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2025 දෙසැම්බර් 31 දිනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතට ගැනෙන රෝහල් හා ආයතනවලට අයත් 2016 වර්ෂයේ සිට පැවත එන වටිනාකම රු. මිලියන 72 ක් වූ කල් ඉකුත් වූ ඖෂධ ගබඩාවල පැවතීම හේතුවෙන්,ඉඩකඩ කළමනාකරණය කර ගැනිමේ ගැටළු පැවති අතර මෙම තොගයන් ඉවත් කිරිම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම දෙපාර්තමේන්තුව ගෙන නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයේ උපදෙස් පරිදි අපහරණය කිරීමට කටයුතු කරමින් පවතින බව. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කල් ඉකුත් වූ ඖෂධ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගම්පහ ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පවත්නා පස්යාල ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය, මීරිගම මූලික රෝහල, සිංහාරමුල්ල ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය, වතුපිටිවල මූලික රෝහල සහ ගම්පහ දිස්ත්‍රික් රෝහල යන ආයතනවලට අයත් ඉඩම් හෙක්ටයාර් 14.4730 ක ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර ඉඩම් නිරවුල් කරවාගෙන භාවිතා කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ රු. මිලියන 45 ක හිඟ ආදායමක් පැවතුණි. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කිරීම කාර්යක්ෂමව සිදු කළ යුතුය. |
| (ඊ) | රු. මිලියන 79 ක් වූ හානි හා පාඩු සම්බන්ධව, පළාත් මූල්‍ය රීති 54 ප්‍රකාරව එම වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම අලාභහානි අතර, අවුරුදු 5 ට වැඩි රු.මිලියන 06 ක් අයවීමට තිබුණි. | හානි පරීක්ෂණ නිර්දේශ ප්‍රකාරව අයකර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව. | පරීක්ෂණවල නිර්දේශ හා මූල්‍ය රීති ප්‍රකාර අයකර ගැනීම් කඩිනමින් සිදුකළ යුතුය. |
| (උ) | දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් 2025 දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති ණය ශේෂය රු.මිලියන 65.5ක් විය. එම ශේෂය තුළ අවුරුදු 1-2 ත් අතර අයවීමට පැවති ණය ශේෂය රු.මිලියන 08 ක්ද අවුරුදු 2-3 ත් අතර අයවීමට පැවති ණය ශේෂය රු.මිලියන 05 ක් ද අවුරුදු 4 ට වැඩි අයවීමට පැවති ණය ශේෂයේ වටිනාකම රු.මිලියන 27 ක්ද විය. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | අයකර ගැනීම් කඩිනමින් කළ යුතුය. |

1.5.14.2 **ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇමරිකන් ජනතාවගේ පරිත්‍යාගයක් ලෙස 2023 වර්ෂයේ මොරටුව ප්‍රාදේශිය රෝහලට ලැබි තිබූ කාමර 10 ක් හා රැස්වීම් ශාලා 02 කින් යුත් ආසන්න වශයෙන් දිග අඩි 40 ක් හා පළල අඩි 25 ක් වූ මහල් දෙකකින් යුත් ගොඩනැගිල්ල සඳහා වායු සමීකරණ 14 ක්, වෝල්ෆෑන් 13 ක්, මෙලමයින් මේස 05 ක්, ඇඳි රහිත පුටු 25 ක්, විධායක පුටු 04ක්, ශිතකරණ 01 ක්, Adjustable ඇඳන් 02 ක් ආදි උපකරණ වලින් සමන්විත කන්ටේනර් ගොඩනැගිල්ල රෝහලට ලැබී වසර දෙකක පමණ කාලයක් ගත වී තිබුණද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගන්නා බව හා උපකරණ රෝහලේ වෙනත් ස්ථාන වෙත ලබා දීමට කටයුතු කරන බව. | පරිත්‍යාග ලෙස ලැබී ඇති වත්කම් ඵලදායි ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මිනුවන්ගොඩ දිසා රෝහල මූලික රෝහලක් බවට උසස් කිරීම අරමුණු කර ගනිමින් 2008 වර්ෂයේදී බස්නාහිර පළාත් අරමුදල් උපයෝජනය කර ගනිමින් 2014 වර්ෂයේ ශල්‍යාගාරයේ වැඩ අවසන් කර තිබුණි. ඒ අනුව 2020 ජනවාරි 31 දින සිට මූලික රෝහලක් ලෙස උත්ශ්‍රේණි ගත කර තිබුණි. එනමුත් ශල්‍යාගාර සංකීර්ණය විවෘත කර වර්ෂ 11 කට වැඩි කාලයක් ගත වී තිබුණද, විගණන දිනය වූ 2026 අප්‍රේල් 17 දින වන විටත්, රෝහල සඳහා නිර්වින්දන විශේෂඥ වෛද්‍ය වරයෙකුගේ සේවය ලැබී නොමැති වීම හේතුවෙන් ශල්‍යකර්ම සිදු නොකර ශල්‍යාගාරය නිශ්කාර්යව පැවතුණි. ඒ හේතුවෙන් අයිතම 112 කට අධික ශල්‍යාගාර උපකරණ හා ද්‍රව්‍ය 507 ක ප්‍රමාණයක් වසර 5 ත් 10 ත් අතර කාලයක සිට භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | රෝහල සඳහා නිර්වින්දන විශේෂඥ වෛද්‍ය වරයෙකුගේ සේවය ලැබී නොමැති අතර වරින් වර විශේෂඥ ශල්‍ය වෛද්‍යවරුන් විසින් ස්ථානීය නිර්වින්දනය (Local Anaesthesia ) ලබා දී සිදුකරන ශල්‍යකර්ම සිදු කර ඇති බව | රෙජීය අමාත්‍යාංශය වෙත දන්වා නිර්වින්දන විශේෂඥ වෛද්‍ය වරයෙකුගේ සේවය ලබා ගැනීමට හා ශල්‍යාගාර සංකීර්ණය විවෘත කර රෝගී සත්කාරක සේවය සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.15 ශීර්ෂ අංක 114 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 1.5.15.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 වර්ෂයේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 111.20 කට ඉදි කරන ලද මීගොඩ ආයුර්වේද රෝහලේ ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත 2025 සැප්තැම්බර් 20 දින සිට ආයුර්වේද වෛද්‍යවරුන් තිදෙනෙකු හා කළමනාකරණ සේවා නිලධාරිනියක් අනුයුක්ත කර තිබුණ නමුත් එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි. එම නිසා ප්‍රතිකාර මධ්‍යස්ථානය හා නේවාසික ඒකක සඳහා මිලදී ගෙන තිබුණු රු. මිලියන 9 ක ලීබඩු උපකරණ හා රු. මිලියනයක ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සහ පාරිභෝජ්‍ය උපකරණ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. තවද, මධ්‍යස්ථානයේ වූ වායු සමීකරණ යන්ත්‍ර අටෙහි වගකීම් කාලයද ඉක්මවා ගොස් තිබුණි. | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නේවාසිකාගාරයේ වැඩ අවසන් කර භාර දී නොමැති බව. | කඩිනමින් වැඩ අවසන් කරවාගෙන රෝගී සත්කාරක සේවා සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.15.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවත්නා ආයතන 33 කට අදාළ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරින් 405 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ දළ වැටුප් රු. මිලියන 462.8 ක් ගෙවා තිබුණි. | බප/ආයු/ආ/02නි.පොදු දරණ 05/01/2026 දිනැති පොදු ලිපිය මඟින් ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කරන ලෙස දන්වා යවා ඇති නමුත් රෝහල් කාර්යමණ්ඩලය වෘත්තීය ක්‍රියාමාර්ගයක් ගතහොත් මහජනතාව අපහසුවට හා පීඩාවට පත් වන බැවින්, මෙම තීරණය ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවක් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර අදාළ ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.15.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි 36 න් 20 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීම සඳහා අදාළ ලියවිලි ඉඩම් කොමසාරිස් වෙත හා මැනුම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව. | දෙපාර්තමේන්තුවට ඉඩම් හා ගොඩනැගිලි කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලුනාව හා මීගොඩ ආයුර්වේද රෝහල්වල 2025 වර්ෂයේ නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත ඖෂධ ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනය නොකිරීම හේතුවෙන් ඖෂධ වර්ග 26 ක් පිටතින් මිලදීගෙන තිබූ අතර රෝහල් තුළ නිෂ්පාදනයට හැකියාව තිබියදී පිටතින් මිලදී ගැනීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට රු. මිලියන 4 ක මූල්‍ය අලාභයක් සිදුව තිබුණි. | චූර්ණ යන්ත්‍ර අක්‍රීය වීම, අයහපත් කාලගුණික තත්ත්ව හා ප්‍රමාණවත් සේවක පහසුකම් නොමැති වීම හේතුවෙන් ඖෂධ නිෂ්පාදනය කිරීමට නොහැකි වූ බව. | රෝහල් තුළ නිෂ්පාදනයට හැකියාව පවතින ඖෂධ නිෂ්පාදනය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් අක්කර 2 පර්චස් 11 ක විශාල භූමි ප්‍රමාණයක පිහිටා තිබෙන යගිරල ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය කාර්යාල භූමියේ වසර ගණනාවක් සිට අනවසර පදිංචිකරුවන් පදිංචිව සිටින නමුත් එකී අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2026 අප්‍රේල් 25 දින වන විටත් අනවසර පදිංචිකරුවන් ඉවත්ව නොමැති බැවින් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා කරන ලෙස නීති නිලධාරී වෙත දන්වා ඇති බව. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර භූමිය ප්‍රයෝජනයට ගත යුතුය. |

### 1.5.16 ශීර්ෂය 115 - සමාජ සේවා දෙපාර්තමේන්තුව

### 1.5.16.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| පළාත් මූල්‍ය රීති 560 | තාවකාලික හෝ ස්ථාවරව පළාත් සභාව සතුව ඇති සියලු වත්කම් ලේඛනගත කළයුතු වුවත්, සමාජ සේවා දෙපාර්තමේන්තුව සතුව පවතින යතුරු පැදි 24 ක්, | යතුරු පැදි සිගාස් වැඩසටහනට ඇතුලත් කිරීමට කටයුතු කරන බව හා වෑන් රථය තක්සේරු කිරීමට නියමිත බව. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව වත්කම් තක්සේරු කර ලේඛන ගත කිරීමට කටයුතු කළ යුතුය. |

වැන් රථය හා සමාලෝචිත වර්ෂයේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග ලෙස ලැබුණු සහ දෙපාර්තමේන්තුව වෙත පවරා දී තිබූ වත්කම් සම්බන්ධව රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 1.5.17 ශීර්ෂ අංක 116 - පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව

#### 1.5.17.1 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බස්නාහිර පළාත් ආයතනගත හා ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන් 2,250 දෙනෙකු වෙනුවෙන් රු.මිලියන 5.7 ක (වැට් රහිත) මිලකට ටී ෂර්ට් සහ බොටම් මිලදී ගැනීමේදි ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් හය දෙනෙකුගෙන් මිලගණන් කැඳවා නිමි ඇඳුම් නිෂ්පාදනය හා සැපයිම සඳහා ලියාපදිංචි වි නොමැති ඉදිකිරීම් කටයුතු සඳහා ICTAD ආයතනයේ ලියාපදිංචිවී තිබූ ආයතනයක් වෙතින් ටී ෂර්ට් සහ බොටම් මිලදි ගෙන තිබූ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ප්‍රකාරව මෙම මිල දී ගැනීම සඳහා සැපයුම්කරු සමග ගිවිසුම් ගත වීමට හෝ එහි 5.4.10 ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදනය ඉතා සීමිත කාලපරිච්ඡේදයකින් ඉටු කිරිමට සිදු වීමත් සමග ලංසු ලේඛනය සකස් කිරීමේදී අතපසුවීමක් සිදුවී ඇති අතර, ඉදිරියේදී එවැනි අතපසුවීම් වළක්වා ගැනීමට කටයුතු කරන බව | ඉදිරියේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

### 1.5.18 ශීර්ෂ අංක 118 - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

#### 1.5.18.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ රු. මිලියන 887 ක හිඟ ආදායමක් පැවතුණි. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කිරීම කාර්යක්ෂමව සිදු කළ යුතුය. |

### 1.5.19 ශීර්ෂ අංක 120 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

#### 1.5.19.1 නීති, රිති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රිති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| පළාත් රිති 54.6 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ ඖෂධ ගබඩාවේ විදුලිය 2024 අප්‍රේල් 11 දින විසන්ධි වීම මත වටිනාකම රු. මිලියන 1.8 ක එන්නත් සහ ඖෂධවලට හානිවී තිබුණි. ඒ අනුව අලාභ හානියක් සිදු වූ දින සිට තුන් මසක් ඇතුලත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් 2026 අප්‍රේල් වන විට අලාභ හානිය සිදු වී වසර 02 කට අධික කාලයක් ගත වී තිබුණද ඒ සම්බන්ධයෙන් රීති ප්‍රකාරව කටයුතු නිම කර නොතිබුණි. | මේ වන විට වායු සමීකරණ පද්ධතිය ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බව හා පැමිණිලි නොමැති බව. | හානි වූ ඖෂධ සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.19.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු. මිලියන 06 ක් වූ හානි හා පාඩු සම්බන්ධව, පළාත් මූල්‍ය රීති 54 ප්‍රකාරව එම වටිනාකම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එම අලාභහානි අතර අවුරුදු 5 ට වැඩි රු.මිලියන 3.5 ක් අයවීමට තිබුණි. | හානි පරීක්‍ෂණ නිර්දේශ ප්‍රකාරව අයකර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව. | පරීක්ෂණවල නිර්දේශ හා මූල්‍ය රීති ප්‍රකාර අයකර ගැනීම් කඩිනමින් සිදුකළ යුතුය. |

### 1.5.20 ශීර්ෂ අංක 121 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### 1.5.20.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | බස්නාහිර පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව තුළ eRL -2 පද්ධතිය ක්‍රියාත්මක කරවීම සඳහා 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ මැයි 12 වන දින දක්වා රු. මිලියන 37 ක මුදලක් බස්නාහිර පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත ගෙවා තිබුණද බස්නාහිර පළාත තුළ eRL 2 ව්‍යාපෘතිය ක්‍රියාත්මකව නොපැවතුණ නමුත් මෙම eRL- 2 පද්ධතිය 2023 ඔක්තෝබර් 03 දින සිට බස්නාහිර පළාත් සභාව හැර අනිකුත් පළාත් සභාවල ක්‍රියාත්මකව පැවතුණි. | පද්ධති හා තාක්ෂණික අඩුපාඩු සපුරාලීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව. | පද්ධතියේ අඩුපාඩු සකස් කර කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 207 ක හිඟ ආදායමක් පැවතුණි. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කිරීම කාර්යක්ෂමව සිදු කළ යුතුය. |

### 1.5.21 ශීර්ෂ අංක 122 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

#### 1.5.21.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ දිස්ත්‍රික්කයේ සණස සමිති 04 ක් ඇතුළුව සමූපකාර සමිති 11 ක 2015-2018 වර්ෂ දක්වා කාලය තුළ සිදුව ඇති මහ පරිමාණ මුදල් අක්‍රමිකතා හා අවිධිමත් ණය ලබා දීම් හේතුවෙන් රු. මිලියන 4,473 කට ආසන්න මූල්‍ය ඌනතා, මූල්‍ය අලාභ සිදු වීම හේතුවෙන් එම සමිති 11 මූල්‍ය අර්බුදයකට ලක් වී තිබුණ නමුත් වසර 07 කට අධික කාලයක් ගතවී තිබුණද ප්‍රඥප්තිය ප්‍රකාරව විශේෂ විගණන හෝ ප්‍රඥප්තියේ 47(2) විමර්ශන පවත්වා වගකිව යුතු පාර්ශව හඳුනාගැනීමට හා මූල්‍ය අලාභ අයකර ගැනීමට සමූපකාර කොමසාරිස්වරයා අපොහොසත් වී තිබුණි. | විමර්ශන සිදු කිරීමට විමර්ශන නිලධාරීන් පත් කර විමර්ශන සිදු කරමින් පවතින බව. | කඩිනමින් විමර්ශන පවත්වා මූල්‍ය අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයන්හි සමූපකාර සමිති 28 ක 2002 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල සමූපකාර සමිති නිලධාරින් විසින් සිදුකරන ලද රු. මිලියන 623 ක මුදල් වංචා හා මුදල් අවභාවිතය සම්බන්ධව වසර 03 ත් 23 ත් අතර කාලයක් ගතවී තිබුණද සමූපකාර කොමසාරිස් හා සහකාර කොමසාරිස්වරුන් ඒ සම්බන්ධව ප්‍රඥප්තියේ 47 (2) ඡේදය ප්‍රකාරව විමර්ශන පවත්වා මූල්‍ය අලාභ අයකරගෙන නොතිබුණි. | විමර්ශන සිදු කිරීමට විමර්ශන නිලධාරීන් පත් කර විමර්ශන සිදු කරමින් පවතින බව. | කඩිනමින් විමර්ශන පවත්වා අදාළ පුද්ගලයන්ගෙන් මූල්‍ය අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බස්නාහිර පළාත් සභාවේ සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය ප්‍රකාර, සෑම සමූපකාර සමිතියක්ම සිය අරමුදල් රාජ්‍ය බැංකුවක ආයෝජනය කළ යුතු අතර සීමා සහිත කොළඹ දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගමය විසින් රු. මිලියන 45 ක් ප්‍රඥප්තියට පටහැනිව අයෝජනය කර තිබුණි. | 2024/2025 වර්ෂ තුළ මෙම ආයතනවලින් කොටසක් මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර ඇති බව. | ප්‍රඥප්තිය ප්‍රකාරව මුදල් ආයෝජන සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එලෙස ප්‍රඥප්තියට පටහැනිව සිදුකළ ආයෝජනයන් ආපසු ලබාගෙන රාජ්‍ය බැංකුවල ආයෝජනය කිරීමට සමුපකාර කොමසාරිස්වරයා කටයුතු කර නොතිබූ අතර ප්‍රඥප්තියේ සඳහන් සමුපකාර සමිති නියාමනය කෙරෙහි සමුපකාර කොමසාරිස්ගේ බලතල ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ඇ) | සමුපකාර ප්‍රඥප්තියට පටහැනිව සී/ස නැගෙනහිර හේවාගම් කෝරලයේ විවිධ සේවා සමුපකාර සමිති විසින් සමුපකාර කොමසාරිස්වරයාගේ අනුමැතියක් රහිතව රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවෙකු නොවන පෞද්ගලික ආයතනයක ආයෝජනය කිරීම නිසා සමිතියට රු. මිලියන 788 ක මූල්‍යමය හානියක් සිදුවී වසර 09 කට අධික කාලයක් ගතවී තිබුණද සමුපකාර ප්‍රඥප්තිය ප්‍රකාරව එම මූල්‍ය අලාභයන් අය කර ගෙන නොතිබුණි. | එවක සිටි අධ්‍යක්ෂ මණ්ඩලයට හා නිලධාරීන්ට එරෙහිව අය කර ගැනීමට කටයුතු කළ යුතු බව විමර්ශන නිලධාරීන් විසින් නිර්දේශ කර ඇති බව හා තීරකකරණය සඳහා තීරකවරුන් පත් කර ඇති බව හා එකී තීරක කටයුතු අත්හිටුවීමට අතුරු තහනම් නියෝගයක් පනවා ඇති බව. | ප්‍රඥප්ති ප්‍රකාරව කටයුතු කර මූල්‍ය අලාභ අය කර ගත යුතු අතර අලාභ අවම කරගත හැකි ආකාරයට ප්‍රඥප්ති සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.22 ශීර්ෂය 125 - කර්මාන්ත දෙපාර්තමේන්තුව

### 1.5.22.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැය රු. මිලියන 13 කට මෝස්තර සහිත සාරි නිෂ්පාදනය හා ඇඳ ඇතිරිලි නිෂ්පාදනය කිරීම සඳහා ජැකාඩ් යන්ත්‍රයක්, රේපියර් යන්ත්‍රයක්, වෝපින් යන්ත්‍රයක් හා වයින්ඩින් යන්ත්‍රයක් ඇතුළු බලවේග යන්ත්‍ර 04 ක් මිලදී ගෙන එම යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය හා සාරි නිෂ්පාදනය සම්බන්ධයෙන් පුහුණු වීමක් සඳහා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය ඇතුළු නිලධාරීන් 04 දෙනෙකු, මාර්ග හා ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරියකු හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරු ලෙස නිලධාරීන් 06 දෙනෙකු සඳහා දින 07 ක ඉන්දීය සංචාරයක් ලබා | ජැකාඩ් යන්ත්‍රය මේ වන විට ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අතර දැනටමත් මෝස්තර සාරි ඇඳුම් රෙදි සැකසීම සිදු කෙරෙන බව හා එම නිෂ්පාදනයන් මහර ගබඩාවට නිකුත් කර ඇති බව. | පිළිතුරු නිවැරදි නොවන අතර යන්ත්‍ර ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නිෂ්පාදනයන් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

දී තිබුණි. වසර 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණද ජැකාඩ් යන්ත්‍රයෙන් සාරි නිෂ්පාදනයක් සිදු වී නොතිබුණි. බලවේග යන්ත්‍ර සැපයීම සම්බන්ධව වූ ගිවිසුම ප්‍රකාරව යන්ත්‍රය සපයා පළමු මාසය තුළ යන්ත්‍ර සැපයුම්කරු විසින් නූල් යොදා නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ යුතු අතර මාස 06 ක් යනතුරු එම ක්‍රියාවලියට සක්‍රිය දායකත්වයක් හා පුහුණුවක් ලබාදිය යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.

### 1.5.23 ශීර්ෂය 126 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

#### 1.5.23.1 කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත තුළ කලාප අධ්‍යාපන කාර්යාල 11 ට අයත් පළාත් පාසල්හි 2024 (2025) වර්ෂයේ පවත්වනු ලැබූ අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා ශිෂ්‍යයන් 81,242 ක් පෙනී සිට තිබූ අතර ඉන් 20,733 ක ප්‍රමාණයක් එනම් ප්‍රතිශතයක් ලෙස සියයට 26 ක් අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා සුදුසුකම් ලබා නොතිබුණි. ඒ අතරින් සියළු විෂයන් අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව 1,041 ක් වූ අතර එය විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 1.28 ක ප්‍රමාණයකි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියළු විෂයන් අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව 192 කින් වැඩි වී තිබූ අතර ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන ප්‍රධාන විෂයන්හි අසමත් වීම සියයට 20 ත් 30 ත් අතර අගයක් ගෙන තිබුණි. | ප්‍රතිශතය නිවැරදි බව හා එය තවදුරටත් අඩු අගයකට ගෙන ආ යුතු බව | සිසුන්ගේ ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන ක්‍රියාත්මක කරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බස්නාහිර පළාත් කලාප අධ්‍යාපන කාර්යාල 11 ට අදාළ පාසල්හි අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා ශිෂ්‍යයින් 53,274 ක් පෙනී සිටි අතර එයින් | ප්‍රතිශතය නිවැරදි බව හා එය තවදුරටත් අඩු අගයකට ගෙන ආ යුතු බව | සිසුන්ගේ ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුය. |

සිසුන් 16,288 ක් හෙවත් සියයට 31 ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වන අවම සුදුසුකම වන මූලික විෂයන් 03 සමත් වීමට හෝ නොහැකි වී තිබුණි.

### 1.5.23.2 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන විසින් අයවැය ක්‍රියාත්මක කිරීම හා වාර්තා කිරීම පිළිබඳ බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ 2021 නොවැම්බර් 02 දිනැති මූල්‍ය චක්‍රලේඛ අංක 10/2021 උපදෙස් අනුව, වැය ශීර්ෂයක් අනුමත වී ඇති, පළාත් සභාවේ සියළුම දෙපාර්තමේන්තු විසින් තම ආයතනය වෙනුවෙන් අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු වුවත්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රකාශය අනුව රු.මිලියන 101 ක් වූ සුභ සාධන වැය විෂයන් හා මූලධන වියදම් වැය විෂයන් සඳහා යෝජිත ක්‍රියාකාරකම් ඇතුළත් කර ක්‍රියාකාරී සැලස්ම පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ඇතුලත් වැය විෂයයන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරනු ලබන අතර , ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලබයි. ඉදිරියේදි මෙම වැය විෂයයන් ඇතුලත් කර ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන බව | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. |

### 1.5.23.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 23 දිනැති අධ්‍යාපන ලේකම්ගේ අංක 20/2021 දරන නවෝත්පාදන විද්‍යාගාර සඳහා පාසල් පාදක ප්‍රදානයන් ලබා දීමේ චක්‍රලේඛය ප්‍රකාරව බස්නාහිර පළාතට අයත් පාසල් 100 ක් සඳහා රු. මිලියන 80 ක ප්‍රතිපාදන වෙන්කර ඒ වෙනුවෙන් 2022 හා 2024 වර්ෂවල පිළිවෙලින් රු. මිලියන 61 ක් හා රු. මිලියන 19 ක් අක්මුදල් පළාත් පාසල් 76 ක් සහ 24 ක් වෙත නිදහස් කර තිබුණි. එහෙත් 2022 වර්ෂයේ දී ලබා දුන් මුදලින් | නවෝත්පාදන විද්‍යාගාර පිහිටුවීම සඳහා ලබා දුන් මූල්‍ය ප්‍රතිපාදන නියමිත කාලසීමාව තුල නිසියාකාරව යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය වූ බැවින් 2025 වර්ෂය ආරම්භයේ සිට ලිපි සහ වට්ස්ඇප් පණිවුඩ මාර්ගයෙන් එහි මූල්‍ය සහ භෞතික ප්‍රගතිය වාර්තා කරන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන් සහ අදාල ප්‍රතිලාභ පාසල් දැනුවත් | නවෝත්පාදන විද්‍යාගාර ස්ථාපිත කිරීමට ලබාදෙන ලද ප්‍රතිපාදන නොපමාව අදාළ කාර්යය සඳහා යෙදවීමට කටයුතු කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | රු.මිලියන 9 ක් සහ 2024 වර්ෂයේදී ලබා දුන් මුදලින් රු.මිලියන 5 ක් ලෙස එකතුව රු. මිලියන 14 ක මුදලක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත කාර්යය සඳහා යොදා නොගෙන පාසල් සංවර්ධන සමිති ගිණුම්වල රඳවාගෙන තිබූ අතර එය ප්‍රතිපාදිත මුදලින් සියයට 17 ක් විය.තවද, පාසල් 03 ක් නවෝත්පාදන විද්‍යාගාර පිහිටුවීම සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. | කිරීමට පියවර ගන්නා ලද බව |

**1.5.23.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවය අතහැර ගිය හා වැඩ තහනම් කරන ලද නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට හෝ කල්ගත වූ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කිරීමෙන් අනතුරුව ණය අයකරගත නොහැකි නම් අතහැරීම සඳහා 2025 මාර්තු 25 දිනැති බස්නාහිර පළාත් ලේකම්ගේ මූල්‍ය චක්‍රලේඛ අංක 06/2025 ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත්, 2026 අප්‍රේල් 24 දින වන විට සේවය අතහැර ගිය නිලධාරින් 109 දෙනෙකුගෙන් හා වැඩ තහනම් කරනු ලැබූ නිලධාරින් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.10,020,273 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.10,020,273 ණය ශේෂයක් අයකර ගැනීමට පවතින බව | චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව හිඟ ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශයේ 2021 අප්‍රේල් 28 දිනැති අංක 6/2021 දරන චක්‍රලේඛයේ 6.1.3 වගන්තිය ප්‍රකාරව පළාත් පාසල්හි කලාප මට්ටමින් ගුරු තුලනය කිරීමෙන් අනතුරුව තවදුරටත් පවතින ඌනතා/ අතිරික්තතා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත කිරීමෙන් පසු ගුරු තුලනය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර බස්නාහිර පළාත තුළ 2025 දෙසැම්බර් 31 දිනට ගුරු සේවයේ | ගුරුවරුන් සඳහා ස්ථාන මාරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතු වුවද, අදාල ගුරුවරුන්ගේ පත් වීම් විෂය හා ස්ථාන මාරු ඉල්ලා ඇති පාසල සඳහා සුදුසු ගුරුභවතෙකුටම ස්ථාන මාරු ලබා දීම් සිදු කළ නොහැකි බව | චක්‍රලේඛය ප්‍රකාරව ගුරු තුලනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතිරික්තතා 1,207 ක් සහ ඌනතා 6,268 ක් විය. එක් එක් අංශය සහ කලාපය අනුව සලකා බැලීමේ දී ද්විතියික අංශයේ ගුරු අතිරික්තතා 482 ක් උසස් පෙළ අංශයේ ගුරු අතිරික්තතා 329 ක් ප්‍රාථමික අංශයේ ගුරු අතිරික්තතා 04 ක් හා 13 වසරක සහතික කළ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනට අදාළව ගුරු අතිරික්තතා 48 ක් සහ අනෙකුත් විෂයන්හි ගුරු අතිරික්තතා 344 ක් පැවතුණි. | | |
| (ඈ) | 2023 දෙසැම්බර් 29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 54/2023 දරන චක්‍රලේඛය හා මාර්ගෝපදේශ අත්පොතෙහි 7.4 වගන්තිය ප්‍රකාරව පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේදී අනුමත අරමුදල් හා සාමාජික ගාස්තු හැර දෙමාපියන්ගෙන් මුදල් ලබා ගැනීමට කටයුතු නොකළ යුතු වුවත් බප/ක/ හොරණ කලාපයට අයත් පාසල විසින් 2024 මාර්තු 13 දිනැති විධායක කමිටු තීරණය අනුව නව සිසුවෙකු පාසලට ඇතුළත් කිරීමේදී රු.3,000 ක මුදලක් අයකර තිබූ අතර 2024 වර්ෂය තුළ 01, 06 සහ 12 ශ්‍රේණි සඳහා ඇතුලත් කර තිබූ සිසුන් 229 දෙනෙකුගෙන් ඇතුලත් වීමේ ගාස්තු ලෙස එකතුව රු.687,000 ක් ලබාගෙන තිබුණි. තවද, 2025 වර්ෂයේදී කලාප කාර්යාල 02 කට අයත් පාසල් 02 කින් පරිත්‍යාග ලෙස සඳහන් කරමින් විවිධ කාර්යයන් වෙනුවෙන් රු. මිලියන 3 ක් වාර්ෂික අයවැයට ඇතුලත් නොකර හා විධිමත් අවසරයකින් තොරව ලබාගෙන ඒ සඳහා පාසල් සංවර්ධන සමිතියේ රිසිට්පත් නිකුත් කර තිබුණි. | අනුමත අරමුදල් හා සාමාජික ගාස්තු හැර දෙමාපියන්ගෙන් මුදල් එකතු කිරීම සිදු නොකරන ලෙස විදුහල්පති වෙත උපදෙස් ලබා දී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව අනුමත අරමුදල් හා සාමාජික ගාස්තු අය කළ යුතු අතර පාසල් සංවර්ධන අරමුදල් විධිමත් පරිදි භාවිතා කිරීමට අදාළ වූ පාසලට උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | රු. මිලියන 23 ක් වූ හානි හා පාඩු සම්බන්ධව, පළාත් මූල්‍ය රීති 54 ප්‍රකාරව එම වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හානි පරීක්ෂණ නිර්දේශ ප්‍රකාරව අයකර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව. | පරීක්ෂණවල නිර්දේශ හා මූල්‍ය රීති ප්‍රකාර අයකර ගැනීම් කඩිනමින් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් 2025 දෙසැම්බර් 31 දිනට අයවීමට පැවති ණය ශේෂය රු.මිලියන 80.5 ක් විය. එම ශේෂය තුළ අවුරුදු 1-2 ත් අතර අයවීමට පැවති ණය ශේෂය රු.මිලියන 09 ක්ද අවුරුදු 2-3 ත් අතර අයවීමට පැවති ණය ශේෂය රු.මිලියන 04 ක් ද අවුරුදු 4 ට වැඩි අයවීමට පැවති ණය ශේෂයේ වටිනාකම රු.මිලියන 24 ක්ද විය. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව | අයකර ගැනීම් කඩිනමින් කළ යුතුය. |